**සැ. යු.-** (i) 2022.05.20 දින පළ වූ අංක 2281 ගැසට් පත්‍රයේ I:II(අ), II, III, IV(අ) සහ IV(ආ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,282 - 2022 මැයි මස 27 වැනි සිකුරාදා - 2022.05.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 884 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 886 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 888 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 892 |


**සැ. යු. -** (i) විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත, 2022 මැයි මස 06 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත, 2022 මැයි මස 06 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2022 ජුනි මස 17 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 ජුනි මස 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# බඩු බාහිරාදිය විකිණීම්

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - ගම්පොල**

රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොකියන ලද නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම අධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් නොකියන ලද නඩු භාණ්ඩ **2022.06.04 වැනි දින පෙ. ව. 9.00** ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් පිළිබඳව හිමිකම් දක්වන්නේ නම් වෙන්දේසිය පවත්වන දිනයේ පෙ. ව. 8.30ට පෙර හිමිකම් තහවුරු කළ යුතු ය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත වෙන්දේසිය පවත්වන දින පෙ. ව. 8.00 සිට 9.00 දක්වා වෙන්දේසියේ විකිණීමට සූදනම් කර ඇති භාණ්ඩයන් පරීක්ෂා කර බැලිය හැකි ය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගන්නා අවස්ථාවේදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ බලය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිලදී ගන්නා භාණ්ඩ එම අවස්ථාවේ දීම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියලුම ගෙවීම් මුදලින් ගෙවිය යුතු අතර, චෙක්පත් භාරගනු නොලැබේ.

06. භාණ්ඩ මිලදී ගන්නා සෑම අයෙකුම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්යය වන අතර, මිලදී ගන්නා සියලුම භාණ්ඩ එදින ප. ව. 4.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

07. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් COVID -19 වසංගතය සම්බන්ධයෙන් නිකුත් කර ඇති උපදෙස් මාලාව අනුව නිසි පරිදි මුඛ ආවරණ පැළඳ තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත රැගෙන එන ලෙස දන්වා සිටිමි.

නාමල් පෙරේරා,<br>
අතිරේක දිසා විනිසුරු/අතිරේක මහෙස්ත්‍රාත්,<br>
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,<br>
ගම්පොල.

2022 මැයි මස 09 වැනි දින,<br>
ගම්පොල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

*උපලේඛනය*

| | *නඩු අංකය* | *පී. ආර්. අංකය* | *භාණ්ඩය* | *ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 01. | B/796/20 | PR/173/20 | දියර ඉසින ප්ලාස්ටික් ටැංකිය | 01 |
| 02. | අංක රහිත | | තහඩු පෙට්ටි | 01 |
| 03. | අංක අපැහැදිලි | | සූට්කේස් පෙට්ටි | 01 |
| 04. | අංක රහිත | | උදලු | 02 |
| 05. | අංක රහිත | | ජංගම දුරකථන | 01 |
| 06. | අංක රහිත | | කම්බි කුඩා ප්‍රමාණයක් | |
| 07. | අංක රහිත | | යකඩ වැලි තාච්චි | 01 |

| නඩු අංකය | පී. ආර්. අංකය | | භාණ්ඩය | ප්‍රමාණය |
|---|---|---|---|---|
| 08. | අංක රහිත | | 1 1/2 වතුර වැල්ව් | 01 |
| 09. | අංක රහිත | | පිත්තල මීටර් සහිත ගෑස් වැල්ව් | 01 |
| 10. | අංක රහිත | | කොන්ඩ් පට්ටම් දොර ලොක් කැබැල්ල සහිත අගුල් ඉබ්බා | 02 |
| 11. | අංක රහිත | | පාන් තැටි | 01 |
| 12. | අංක රහිත | | ඇලුමිනියම් තැටි | 02 |
| 13. | අංක රහිත | | ඇලුමිනියම් පියන | 02 |
| 14. | අංක රහිත | | යකඩ හතරැස් බටය සහ යකඩ කම්බි කැබලි | 01 |
| 15. | අංක රහිත | | අබලන් විදුලි හොට් ප්ලේට් | 02 |
| 16. | අංක රහිත | | විදුලි පන්දම් | 01 |
| 17. | අංක රහිත | | බිඳී ඇති වාහන කණ්ණාඩි | 01 |
| 18. | අංක රහිත | | වාහන සංඥා ලාම්පු | 01 |
| 19. | අංක රහිත | | ස්පීකර් බෆල් | 02 |
| 20. | අංක රහිත | | විදුලි හෝල්ඩර් | 01 |
| | | | ප්ලාස්ටික් හැඩල් | 01 |
| 21. | අංක රහිත | | පාපැදි මඩ කවර | 01 |
| 22. | අංක රහිත | | විසි කැති | 01 |
| 23. | අංක රහිත | | විදුලි පන්දම් | 01 |
| 24. | අංක රහිත | | සවල් | 01 |
| 25. | අංක රහිත | | සවල් | 01 |
| 26. | අංක රහිත | | ඇලුමිනියම් මුට්ටි | 01 |
| 27. | අංක රහිත | | ඇලුමිනියම් මුට්ටි | 01 |
| 28. | අංක රහිත | | ඇලුමිනියම් කළ | 01 |
| 29. | අංක රහිත | | ඇලුමිනියම් කැඩුණු කේතල් මූඩි | 01 |
| 30. | අංක රහිත | | පොරෝ | 01 |
| 31. | අංක රහිත | | ගෙවිගිය උදලු | 01 |
| 32. | අංක රහිත | | ප්ලාස්ටික් බාල්දි | 01 |
| 33. | අංක රහිත | | තහඩු බාල්දි | 01 |
| 34. | අංක රහිත | | ප්ලාස්ටික් බට කැබලි | 01 |
| 35. | 9249 | PR/564 | ගෑස් සිලින්ඩර් | 01 |
| 36. | 9249 | PR/564 | ගෑස් ලිප් | 01 |
| 37. | අංක රහිත | | යකඩ පටි | 01 |
| 38. | අංක රහිත | | තරාදි පඩි | 03 |
| 39. | 17158/19 (B/9582/17) | PR/1186/17 | KENTON වර්ගයේ පාපැදිය | 01 |
| 40. | 24573/21(බී/1087/19) | PR/674/19 | SUZUKI වර්ගයේ WP BAZ 2085 අංක දරන යතුරු පැදිය කොටස්කර වෙන්දේසිය සඳහා | 01 |

# තොටුපළ් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**මඩකලපුව දිස්ත්‍රික්කයේ මණ්මුනයි දකුණ එරුවිල් පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**
**එරුවිල් සහ මාංකාඩු රා තැබෑරුම් රේන්ද විකිණීම - 2022 ජූලි 01 දින සිට 2023 ජුනි 30 දින දක්වා**

අංක 207 දරන 1982.08.20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකරන ලද රා තැබෑරුම් රේන්ද විකිණීමේ විධිවිධාන අනුව මඩකලපුව දිස්ත්‍රික්කයේ මණ්මුනයි දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ එරුවිල් සහ මාංකාඩු රා තැබෑරුම් සඳහා **2022 ජූලි මස 01 වැනි දින සිට 2023 ජුනි මස 30 වැනි දින** දක්වා රා විකිණීමේ පෞද්ගලික අයිතියට ටෙන්ඩර් ඉල්ලුම්පත් පහත සඳහන් දින හා වේලාව දක්වා මණ්මුනයි දකුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී බාර ගනු ලැබේ. ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවේ ටෙන්ඩර්කරුවන් මණ්මුනයි දකුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පවත්වන ටෙන්ඩර් මණ්ඩල රැස්වීම සඳහා පැමිණ සිටිය යුතුය.

01. ටෙන්ඩර් ඉල්ලුම්පත්‍රය වෙනුවෙන් රුපියල් එක්දහස් පන්සීයක (රු. 1,500) මුදලක් මණ්මුනයි දකුණ ප්‍රාදේශීය ලේකම් නමින් ගෙවා ලබා ගන්නා ලද රිසිට්පත ඉදිරිපත් කිරීමෙන් ඉල්ලුම්පත ලබා ගත හැකි ය. ටෙන්ඩර්පත සමග රිසිට්පත අමුණා තිබිය යුතු ය. ටෙන්ඩර්පත් නිකුත් කරනු ලබන්නේ 2022.06.01 වැනි දින සිට 2022.06.22 වැනි දින ප. ව. 3.00 දක්වා වේ.

02. ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන වටිනාකම් සහතික ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරනු ලබන මුදලින් 15% ට අඩු නොවිය යුතු ය. මෙම වටිනාකම් සහතිකය ටෙන්ඩර්පත්‍ර සමග ඇමිණිය යුතු ය.

03. ටෙන්ඩර්පත් වැරදි ලෙස පුරවා තිබේ නම් එය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ටෙන්ඩර්පත් ඉදිරිපත් නොකර ටෙන්ඩර්පත් සඳහා ගෙවන ලද මුදල නැවත ලබා ගැනීමට අවශ්‍ය නම් ඔබගේ ඉල්ලීම ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ දින සිට සති දෙකක් තුළ ඔබ ලබාගත් ටෙන්ඩර්පත සම්පූර්ණ නොකර මුදල් ගෙවූ රිසිට්පත සමග නැවත ඉදිරිපත් කරන්නේනම් එම ඉල්ලීම සලකා බලනු ලැබේ.

05. තැබෑරුම දැනට පවත්වන ස්ථානයේ ඉදිරි කාලයේත් අඛණ්ඩව පවත්වා ගෙන යාමට ලැබේ දැයි සහතික විය නොහැක.

06. ලියාපදිංචි කළ පොල් හා තල් සමුපකාර සමිති මෙම රේන්ද විකිණීමේ දී සහභාගි වන්නේ නම් සමිතිය පිහිටුවා ඇති ප්‍රදේශයට අයත් රා තැබෑරුම සඳහා පමණක් ඉල්ලුම්පත ඉදිරිපත් කළ හැකි අතර දැනට සමිතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳව ද හා රා තැබෑරුම බදු ගෙන පවත්වා ගෙන යාමට ඇති හැකියාව පිළිබඳව ද මඩකලපුව දිස්ත්‍රික් සහකාර සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් සහතික කරන ලද ලිපිය ඉදිරිපත් කිරීමෙන් පසුව ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ. (මුදල් අමාත්‍යාංශයේ අංක 01/2012 හා 2012.01.05 දින දරන චක්‍රලේඛය අනුව තිබිය යුතුය.)

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර මණ්මුනයි උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකිය.

සිවප්‍රියා විල්වරද්නම්,
ප්‍රාදේශීය ලේකම්.

2022 අප්‍රේල් මස 30 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මණ්මුනයි දකුණ එරුවිල් පත්තු.

**උපලේඛනය**

| *තැබෑරුම් පිහිටුවිය යුතු ස්ථානය* | *තැබෑරුම් පිහිටුවිය යුතු ස්ථාන* | *තැබෑරුම් අංකය* | *ටෙන්ඩර් ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනය* | *වේලාව* |
|---|---|---|---|---|
| මාංකාඩු ගම | මාංකඩු | TT No. 4 | 2022.06.23 | පෙ. ව. 11.30 |
| එරුවිල් ගම | එරුවිල් | TT No. 6 | 2022.06.23 | පෙ. ව. 11.30 |

**සටහන** .- 1. ටෙන්ඩර් මණ්ඩල **2022.06.23** වැනි දින **පෙරවරු 11.30** ට රැස්වේ.

2. විකුණුම් දින සුදුසු බදුකරු තෝරා නොගතහොත් නැවත විකිණීම **2022.06.30 වැනි දින පෙරවරු 11.30**ට පැවැත්වේ.

05-149

**මණ්මුනයි පත්තු, ආරයම්පති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - මඩකලපුව දිස්ත්‍රික්කය**

*රා තැබෑරුම් රේන්ද විකිණීම 2022 ජූලි මස 01 දින සිට - 2023 ජූනි මස 30 දින දක්වා*

අංක 207 දරන 1982.08.20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද රා තැබෑරුම් රේන්ද විකිණීමේ විධිවිධානයට අනුව මඩකලපුව දිස්ත්‍රික්කයේ මණ්මුනයි පත්තු, ආරයම්පති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම් සඳහා **2022 ජූලි මස 01** වැනි දින සිට **2023 ජූනි මස 30** වැනි දින දක්වා රා විකිණීමේ පෞද්ගලික අයිතියට ටෙන්ඩර් ඉල්ලුම්පත් පහත සඳහන් දින හා වේලාව දක්වා මණ්මුනයි පත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී භාර ගනු ලැබේ. ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවේ ටෙන්ඩර්කරුවන් මණ්මුනයි පත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පවත්වන ටෙන්ඩර් මණ්ඩල රැස්වීම සඳහා පැමිණ සිටිය යුතු ය.

01. ටෙන්ඩර් ඉල්ලුම්පත්‍රය වෙනුවෙන් රුපියල් එක්දහස් පන්සියයක (රු. 1,500) මුදලක් මණ්මුනයි පත්තු ප්‍රාදේශීය ලේකම් නමින් ගෙවා ලබාගන්නා ලද රිසිට්පත ඉදිරිපත් කිරීමෙන් ඉල්ලුම්පත් ලබාගත හැකිය. ටෙන්ඩර්පත සමග රිසිට්පත අමුණා තිබිය යුතු යි. ටෙන්ඩර්පත් නිකුත්කරනු ලබන්නේ **2022.05.27 වැනි දින සිට 2022.06.10** දින පස්වරු 3.00 දක්වා වේ.

02. ඒ ඒ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන වටිනාකම් සහතික ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර්පත්‍රයේ සඳහන් කරනු ලබන මුදලින් 15% ට අඩු නොවිය යුතු ය. මෙම වටිනාකම් පත්‍රයේ මුල් පිටපතක් ටෙන්ඩර්පත්‍ර සමග ඇමිණිය යුතුයි.

03. ටෙන්ඩර්පත් වැරදි ලෙස පුරවා තිබේනම් එය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ටෙන්ඩර්පත් ඉදිරිපත් නොකර ටෙන්ඩර්පත් සඳහා ගෙවන ලද මුදල නැවත ලබා ගැනීමට අවශ්‍යනම් ඔබගේ ඉල්ලීම, ටෙන්ඩර් මණ්ඩල රැස්වීම දින සිට සති දෙකක් තුළ ඔබ ලබාගත් ටෙන්ඩර් ඉල්ලුම් පත සම්පූර්ණ නොකර මුදල් ගෙවූ රිසිට්පත සමග නැවත ඉදිරිපත් කරන්නේනම් එම ඉල්ලීම සළකා බලනු ලැබේ.

05. තැබෑරුම දැනට පවත්වන ස්ථානයේ ඉදිරි කාලයේත් අඛණ්ඩව ලබා දීමට හැකි දැයි සහතික කිරීමට නොහැක.

06. ලියාපදිංචි කළ පොල් හා තල් සමුපකාර සමිති මෙම රේන්ද විකිණීමේ දී සහභාගි වන්නේ නම් සමිතිය පිහිටුවා ඇති ප්‍රදේශයට අයත් රා තැබෑරුම සඳහා පමණක් ඉල්ලුම්පත ඉදිරිපත් කළ හැකි අතර දැනට සමිතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳව ද හා රා තැබෑරුම බදු ගෙන පවත්වා ගෙන යාමට ඇති හැකියාව පිළිබඳව ද මඩකලපුව දිස්ත්‍රික් සහකාර සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් සහතික කරන ලද ලිපිය ඉදිරිපත් කිරීමෙන් පසුව ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ. (මුදල් අමාත්‍යාංශයේ අංක 01/2012 හා 2012.01.05 වැනි දින දරන චක්‍රලේඛය අනුව තිබිය යුතු ය)

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර මණ්මුනයි පත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

න. සදානන්ති,<br>
ප්‍රාදේශීය ලේකම්.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,<br>
මණ්මුනයි පත්තු,<br>
මඩකලපුව.<br>
2022 අප්‍රේල් මස 27 වැනි දින,

**උපලේඛනය**

| *තැබෑරුම් පිහිටුවිය යුතු ස්ථානය* | *තැබෑරුම් අංකය* | *ටෙන්ඩර් ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනය හා වේලාව* | |
|---|---|---|---|
| | | *දිනය* | *වේලාව* |
| මණ්මුනයි පත්තු | ආරයම්පති - දකුණ ග්‍රාම නිලධාරි වසම | 2022.06.13 | පෙ. ව. 9.30 |

***සටහන*** .- 1. ටෙන්ඩර් මණ්ඩලය **2022.06.13** වැනි දින පෙ. ව. **10.30** ට රැස්වේ.

2. විකුණුම් දින සුදුසු බදුකරු තෝරා නොගතහොත් නැවත විකිණීම **2022.06.16** වැනි දින පෙ. ව. **10.30** ට පැවැත්වේ.

05-150

# රජයේ නොවන දැන්වීම්

## ඇටර්නි බලය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීමයි

කැළණිය ගෝමිස් මාවතේ, අංක 40 හි මැක්ස්මා දිල්රුක්ෂි අයෝමා ගෝමිස් වන මා විසින් කැළණිය, ගෝමිස් මාවතේ, අංක 40 හි තොන්ඩමන් ආරච්චිගේ ටෙරාසි ජෙරාඩ් ගෝමිස් යන අය වෙත ප්‍රදානය කරන ලද කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ පවත්වාගෙන යන ලිඛිත බලධාරි පොතේ ලියාපදිංචි කර ඇති මාකොළ ප්‍රසිද්ධ නොතාරිස් අර්නස්ට් මැක්සිනස් රත්න එගොඩවත්ත විසින් ලියා සහතික කරන ලද අංක 4476 හා 2013 ඔක්තෝබර් මස 01 දින දරන ඇටර්නි බලය වහාම ක්‍රියාත්මක වන පරිදි මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කර අහෝසි කර අවලංගු කරනු ලබන බවත් එකී ඇටර්නි බලය යටතේ සිදු කරනු ලබන හෝ එළඹෙනු ලබන කවර හෝ ක්‍රියාවකට හෝ ගනුදෙනුවකට මෙතැන් පටන් මා වගකීමක් නොදරනු ඇති බවත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් පොදු මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

මැක්ස්මා දිල්රුක්ෂි අයෝමා ගෝමිස්.

05-155

---

## ඇටර්නි බලය අවලංගු කිරීමයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සහ සියලු දෙනාගේ ම දැනගැනීම පිණිස මෙසේ දැනුම් දෙනු ලැබේ.

පන්නිපිටිය, දෙපානම, අංක 47 හි පදිංචි රුවිනි සඳමාලා අබේසිංහ වන මා විසින් ජී. එච්. සවුරාජ් ප්‍රසිද්ධ නොතාරිස් විසින් වර්ෂ 2004 ක් වූ සැප්තැම්බර් මස 01 වැනි දින ලියා සහතික කරන ලද අංක 207 දරන ඇටර්නි බලපත්‍රය මගින් පන්නිපිටිය, දෙපානම අංක 47 හි පදිංචි රත්නමාලි සිරිකාන්ති අබේසිංහ දිසානායක වෙත පවරන ලද ඇටර්නි බලය 2022.03.09 වැනි දින සිට අවලංගු කර ශුන්‍ය කර බලරහිත කරන ලද බවත්, මෙතැන් සිට එකී රත්නමාලි සිරිකාන්ති අබේසිංහ දිසානායක යන අය මා වෙනුවෙන් කරනු ලබන කිසිම ක්‍රියාවක් සම්බන්ධයෙන් හෝ ඇතුළත් වනු ලබන කිසිම ගිවිසුමක් සම්බන්ධයෙන් මා වගකියනු නොලබන බවත් ශ්‍රී ලංකා ජනරජයටත්, මහජනතාවටත් දන්වා සිටිමි.

රුවිනි සඳමාලා අබේසිංහ.

05-157

---

## ඇටර්නි බලය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සහ සියලු දෙනාගේ ම දැනගැනීම පිණිස මෙසේ දැනුම් දෙනු ලැබේ.

පන්නිපිටිය, දෙපානම, අංක 47 හි පදිංචි රුවිනි සඳමාලා අබේසිංහ වන මා විසින් යූ. ජේ. හිරිමුතුගොඩ ප්‍රසිද්ධ නොතාරිස් විසින් වර්ෂ 2000 ක් වූ ජූලි මස 25 වැනි දින ලියා සහතික කරන ලද අංක 4004 දරන ඇටර්නි බලපත්‍රය මගින් කොළඹ 03, ශාන්ත මයිකල් පාර, අංක 87 හි පදිංචි රත්නායක මුදියන්සේලාගේ අමර වීරබාහු වෙත පවරන ලද ඇටර්නි බලය 2022.03.09 වැනි දින සිට අවලංගු කර ශුන්‍ය කර බලරහිත කරන ලද බවත්, මෙතැන් සිට එකී රත්නායක මුදියන්සේලාගේ අමර වීරබාහු යන අය මා වෙනුවෙන් කරනු ලබන කිසිම ක්‍රියාවක් සම්බන්ධයෙන් හෝ ඇතුළත් වනු ලබන කිසිම ගිවිසුමක් සම්බන්ධයෙන් මා වගකියනු නොලබන බවත් ශ්‍රී ලංකා ජනරජයටත්, මහජනතාවටත් දන්වා සිටිමි.

රුවිනි සඳමාලා අබේසිංහ.

05-158

---

## ඇටර්නි බලය අවලංගු කිරීම

පිළියන්දල, බෝකුන්දර, කුරුදුවත්ත පාර, අංක 239/7 දරන තෙමහල් නිවසේ පළමුවන සහ දෙවන මහලේ පදිංචි අංක 566314398 V දරන ජාතික හැඳුනුම්පත හිමි (කලින් අංක N 2261742 හා දැන් අංක N7878685 දරන විදේශීය ගමන් බලපත්‍රය හිමි) පල්ලාවල කපුරුබණ්ඩාරගේ සුසිලාවතී වන මම ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඩී. එස්. පෙරේරා විසින් වර්ෂ 2019 ක් වූ පෙබරවාරි මස 11 වැනි දින ලියා සහතික කළ අංක 6101 දරන විශේෂ ඇටර්නි ඔප්පුව මගින් කොළඹ 6, වැල්ලවත්ත, ප්‍රනාන්දු පාර, අංක 26/11 හි පදිංචි අංක 770272050 V දරන ජාතික හැඳුනුම්පත හිමි ගමගේ ලක්ෂ්මන් නන්දන පෙරේරා යන අය වෙත පවරන ලද ඉහත කී ඇටර්නි බලපත්‍රය අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කළ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි. මින් ඉදිරියට එකී ගමගේ ලක්ෂ්මන් නන්දන පෙරේරා වෙනුවෙන් කරනු ලබන කිසිම ක්‍රියාවකට මා වග නොකියන බව දන්වා සිටිමි.

පල්ලාවල කපුරුබණ්ඩාරගේ සුසිලාවතී.

05-166

---

## ඇටර්නි බලය අවලංගු කිරීම

අංක 11, ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථාන පාර, වැල්ලවත්ත, කොළඹ 06 ලිපිනයේ පදිංචි සසිකලා සිවකොලුන්තු විවාහයට පෙර කුමරසුවාමි සහ වෛතිලිංගම් ධර්මරත්නම් සිවකොලුන්තු වන අපි අංක 24/16 V ශ්‍රී සංගබෝ පාර, කවුඩාන, දෙහිවල ලිපිනයේ පදිංචි ජෝර්ජ් ෆීලික්ස් තෝමස් වෙත ලබා දුන් 2014 නොවැම්බර් මස 12 දිනැති ප්‍රසිද්ධ නොතාරිස් නාදන් ශ්‍රීධරන් අත්සන් කරන ලද ඇටර්නි බලපත්‍රය 2021.06.28 දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කර ඇති බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට සහ එහි ජනතාවට මෙයින් දන්වා සිටිමි.

සසිකලා සිවකොලුන්තු,
වෛතිලිංගම් ධර්මරත්නම් සිවකොලුන්තු.

05-167

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

උතුරු මැද පළාතේ, අනුරාධපුර, මාතලේ හන්දිය, අංක 181 1/2 ලිපිනයේ පදිංචි (ජාතික හැඳුනුම්පත් අංක 732511091 V හිමි) ගාර්දියේ පුංචිහේවාගේ ප්‍රදීප් චමින්ද වන මම අනුරාධපුර මහාධිකරණ කලාපය තුළ ප්‍රසිද්ධ නොතාරිස් මදාර විජේසිංහ මිය විසින් ලියා සහතික කළ අංක 365 දරන 2021.12.13 දිනැති විශේෂ ඇටර්නි බලපත්‍රය මගින් අනුරාධපුර, L. S. පාර, අංක 17 ලිපිනයේ අම්බලන්ගොඩගේ ප්‍රදීප් නිලන්ත දේශප්‍රිය (ජාතික හැඳුනුම්පත් අංක 761812882 V) අය වෙත ඇටර්නි බලතල ලබා දී ඇත. එකී ඇටර්නි බලපත්‍රය අනුරාධපුර දිස්ත්‍රික් සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ ඇටර්නි බලපත්‍ර පොතේ 02 කාණ්ඩයේ 02 පත් ඉරුවේ 406 දින පොත් අංක යටතේ ලියාපදිංචි කොට ඇත.

මා විසින් පැවරනු ලැබූ එම ඇටර්නි බලතල මින් අවලංගු කරන බවද, මින් ඉදිරියට ඉහත කී ඇටර්නි බලපත්‍රය ප්‍රකාර කරනු ලබන කිසිදු ක්‍රියාවකට මා විසින් වග නොකියන බවද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට සහ එහි ජනතාවට මෙයින් දන්වා සිටිමි.

ගාර්දියේ පුංචිහේවාගේ ප්‍රදීප් චමින්ද.

අංක 181 1/2, මාතලේ හන්දිය,
අනුරාධපුරය.

05-171

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම සම්බන්ධවයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව, පෙරියමුල්ල, යෝර්න් වීදිය, අංක 22 දරන ස්ථානයෙහි පදිංචි ''මොහමඩ් හවුත් හසීම් (ජා. හැ. ප අංක 623100383 V) වන මම ප්‍රකාශ කර සිටින්නේ ප්‍රසිද්ධ ඒ. ඒ. බෂීර් අහමඩ් මහතා විසින් වර්ෂ 2010 ජූලි මස 28 වැනි දින ලියා සහතික කරන ලද අංක 6221 විශේෂ ඇටර්නි බලපත්‍රය මගින් මීගමුව, මීරිගම පාර, අංක 453/3, දරන ස්ථානයෙහි පදිංචි ''මීරාන් මොහිදීන් ශානවස්'' යන අය වෙත ඇටර්නි බලය මා විසින් පවරා දෙන ලද බවයි. මා ප්‍රකාශ කර සිටින්නේ, ඉහත මීරාන් මොහිදීන් ශානවස් යන අය වෙත පවරන ලද එකී අංක 6221 දරන ඇටර්නි බලය වර්ෂ 2022 ක් වූ මැයි මස 19 වැනි දින පටන් මෙයින් අවලංගු කරන බවය.

මොහමඩ් හවුත් හසීම්.

05-173

---

## 2007 අංක 07 දරන සමාගම් පනතේ 244 (3) වන වගන්තිය ප්‍රකාරව සමාගම් ඒකාබද්ධ කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමයි

සන්ෂයින් කන්සියුමර් ලංකා ලිමිටඩ් සමාගම, ඩෙයින්ටී ලිමිටඩ් සමාගම සමග ඒකාබද්ධ කිරීම

සන්ෂයින් කන්සියුමර් ලංකා ලිමිටඩ් සමාගම (සමාගම් අංකය : PB 3812), ඩෙයින්ටී ලිමිටඩ් සමාගම (සමාගම් අංකය : PB 439) සමග ඒකාබද්ධ කරන ලද බව හා 2007 අංක 07 දරන සමාගම් පනතේ 244(1)(අ) වගන්තිය ප්‍රකාරව සමාගම් ඒකාබද්ධ කිරීමේ සහතිකය සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් 2022 අප්‍රේල් මස 2 වැනි දින නිකුත් කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 244(3) වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

2007 අංක 07 දරන සමාගම් පනතේ 244(2) වගන්තිය ප්‍රකාරව ඒකාබද්ධ කිරීම 2022 අප්‍රේල් මස 2 වැනි දින සිට බලාත්මක වන අතර ඉහත සඳහන් ඒකාබද්ධ කරනු ලබන සමාගම් 2022 අප්‍රේල් මස 2 වැනි දින සිට සන්ෂයින් කන්සියුමර් ලංකා ලිමිටඩ් සමාගම යන නමින් පවත්වාගෙන යනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

කෝපරේට් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්,
සමාගම් ලේකම්වරුන්.
සන්ෂයින් කන්සියුමර් ලංකා ලිමිටඩ්.

05-175

---

## ඇටර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර පූර්ණවත්ත, පූර්ණ පටුමග අංක 08, යන ලිපිනයෙහි පදිංචි රංජිත් පෙරේරා වන මා විසින් (හැඳුනුම්පත් අංක 196205210015) මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ජීවා ඩී. ප්‍රසංගනී පියතිලක මහත්මිය විසින් සහතික කරන ලද අංක 05 හා 1999 ජූලි 05 දින දරන ඇටර්නි බලපත්‍රය මගින් මාගේ ඇටර්නි බලකරු ලෙස ධර්මසේන පාර, අංක 22 ලිපිනයෙහි පදිංචි ආනන්ද පෙරේරා (ජාතික හැඳුනුම්පත් අංක 650691911 V) යන අයව පත්කළ බවත් එකී ඇටර්නි බලපත්‍රය ශුන්‍ය හා බලරහිත කර ප්‍රත්‍යාදිෂ්ඨ කළ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එහි මහජනතාවටත් මෙමගින් දැනුම් දෙනු ලැබේ.

රංජිත් පෙරේරා.

05-183

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර, පහත සඳහන් සමාගම, 2021 ජුනි මස 09 වැනි දින සංස්ථාගත කරන ලද බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : සුපර් මයින්ඩ්ස් ග්ලෝබල් ඇකඩමි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : PV 00240435
ලියාපදිංචි කාර්යාල ලිපිනය : අංක 41/2, ජය කොන්ත පටුමග, කිරුළ පාර, කොළඹ 05.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්,

සමාගම් ලේකම්.

ග්‍රෙගරිස් පාර්ට්නර්ස්,
53/3, ග්‍රෙගරි පාර,
කොළඹ 07.

05-184

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

කොළඹ 07, බාන්ස් පෙදෙස, අංක 76 පදිංචි දූනට, රාජගිරිය නාවල, ගල්පොත්ත පාර, අංක 42 හි පදිංචි, කසුන් සන්දීප පතිරණ වන මම, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එල්. සිරිරත්න බණ්ඩාර විසින් සහතික කරන ලද කොළඹ 07, බාන්ස් පෙදෙස, අංක 76 පදිංචි දූනට රාජගිරිය, නාවල, ගල්පොත්ත පාර, අංක 42 හි පදිංචි ගයන්ත සම්පත් පතිරණ වෙත ප්‍රදානය කරන ලද 1997.10.15 දිනැති හා අංක 205 දරන ඇටර්නි බලපත්‍රය මෙදින සිට බලපවත්වන පරිදි මා විසින් අවලංගු කරන ලද බව හා එය තවදුරටත් නීතිය ඉදිරියේ බලරහිත බවට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මහජනතාවට මෙයින් දන්වා සිටිමි.

මෙදින සිට බලපවත්වන පරිදි ඉහත කී ගයන්ත සම්පත් පතිරණ විසින් ඉහත කී ඇටර්නි බලය යටතේ කරනු ලබන කවර හෝ කිසියම් ක්‍රියාවකට මා විසින් වග කියනු නොලබන බව ද මෙයින් ප්‍රකාශ කර සිටිමි.

කසුන් සන්දීප පතිරණ.

05-185

---

## විශේෂ ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

කෝට්ටෛට, කල්ලාරු 1 කලුවාන්චිගුඩි මඩකලපුව දෙසට අංක 4 සෙරිංටන් කෝර්ට් 736 වෛටන් අවන්යු වෙස්ට් නෝර්ත් යූබී 5 4ජෙයු ලන්ඩන් පුරිත්තානියා දරන ලිපිනයේ පදිංචි කෝණමලෙ නවලීලා ජාතික හැඳුනුම්පත් අංක 715474166 V ගුවන් බලපත්‍ර අංක එන් 1616780 වන මම ප්‍රසිද්ධ නොතාරිස් ඒ. කේ. සිරිදරන් සහතික කළ 2022.02.19 දිනැති විශේෂ ඇටර්නි බලපත්‍රය මගින් ඇලුත්තුකාරන් පාර කෝට්ටෛකල්ලාරු 2 මඩකලපුව පදිංචි දබ්බියප්පා වේලායුදම් ජාතික හැඳුනුම්පත් අංක 481725274 V වෙත පවරන බලතල මඩකලපුව නැගෙනහිර කොට්ඨාස රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2022.02.19 දින අංක 254 වන අනු අංක 68 වැනි පොතින් 30 වැනි ජේදයේ ලියාපදිංචි කර තිබූ විශේෂ ඇටර්නි බලපත්‍රය අවලංගු කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් දන්වා සිටිමි. තව ද, දබ්බියප්පා වේලායුදම් විසින් ඉදිරියේ දී සිදු කරන ලද යම් හෝ සියලුම ගනුදෙනු වෙනුවෙන් මාගේ කිසිම සම්බන්ධතාවයක් නැති බව සඳහන් කරමි.

කෝණමලෙ නවලීලා.

05-187

## සමාගමක නම වෙනස් කිරීම පිළිබඳ මහජනතාව වෙත දැනුම්දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තියට අනුව, පහත සඳහන් පුද්ගලික සීමාසහිත වගකීම් සමාගම 2022 මැයි 5 වැනි දින එහි නම වෙනස් කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ මුල් නාමය : කළම්බු සෙන්ටර් ෆෝ කොග්නිටිව් කම්පියුටිං (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගමේ අංකය : පීවී 94178

ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : 3 වන මහල, අංක 11, කාසල් පටුමග, කොළඹ 04.

සමාගමේ නව නාමය : කිව්බොක්ස් කෝප් (ප්‍රයිවට්) ලිමිටඩ්

එකවුන්ටින් සිස්ටම්ස් සෙක්‍රටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

03 වන මහල, අංක 11, කාසල් පටුමග, කොළඹ 04.

05-198

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ඩෙවිඩ් බංගලාව, ඩේවිඩ් වත්ත පාර, මීගමුව හි පදිංචි වින්ස්ටන් සෙක්ටස් ඉලංගමුවේ ඉලංගන්තිලක (ජා. හැ. ප. අංක 412200152 V) වන මම නුවර මැණික්හින්න දෙඩම්ගොල්ල ''නයනා'' අංක 15 හි පදිංචි නානායක්කාර වර්ණකුල පටබැඳිගේ සමන් උදය කුමාර පෙරේරා (ජා. හැ. ප. අංක 711671633 V) යන අයව ඇටර්නි බලකරු වශයෙන් පත් කරන ලද එච්. එම්. ඩී. රොබට් හීන්කෙන්ද විසින් ලියා සහතික කළ අංක 2894 සහ වර්ෂ 2021.03.17 දින දරන විශේෂ ඇටර්නි බලපත්‍රය වර්ෂ 2022.05.25 වැනි දින සිට මෙයින් අවලංගු කර බල රහිත කරමි.

මෙම දිනයෙන් පසු එකී ඇටර්නි බලකරු වන නානායක්කාර වර්ණකුල පටබැඳිගේ සමන් උදය කුමාර යන අය මෙම ඇටර්නි බලපත්‍රයට අදාලව කරන කිසිම ක්‍රියාවකට මා වග නොකියන බව ශ්‍රී ලංකා රජයට හා මහජනතාවට මෙයින් දන්වා සිටිමි.

ඩබ්. එස්. ඉලංගමුවේ ඉලංගන්තිලක.

2022 මැයි මස 20 වැනි දින.

05-199

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

අම්බලන්තොට, ලුණාව දකුණ, රජසරණගම ග්‍රාමෝදය මාවත, 351/ඒ පදිංචි චන්ද්‍රන තිලක ගමගේ (ජා. හැ. අංක 853601667 V) වන මා වෙත වර්ෂ 2018.07.03 වන දින තිශ්‍යා විජේසූරිය නීතිඥ ප්‍රසිද්ධ නොතාරිස්/දිවුරුම් කොමසාරිස් තැන විසින් ලියා පවරන ලද අංක 5094 දරන විශේෂ ඇටර්නි බලපත්‍රය මගින් පවරා ඇති බලතල අද පටන් අත් හරින බවත් ඉහත කී අංක 5094 දරන විශේෂ ඇටර්නි බලපත්‍රය අවලංගු කරන බවත්, ශ්‍රී ලංකා ජන රජයටත්, ශ්‍රී ලංකාවාසි ජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

චන්ද්‍රන තිලක ගමගේ.

2022 මැයි මස 06 වැනි දින.

05-200

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

කටාන, කළුවාරිප්පුව - නැගෙනහිර, මිග්සිටි නැගෙනහිර, අංක 91/5 හි හා දූනට ඒකල, යකිනාරන්කටුව, අංක 58 දරන ස්ථානයෙහි පදිංචි වජ්ජක්කාර කංකානම්ලාගේ එඩ්මන්ඩ් අජිත් ප්‍රසන්න ඩයස් හා ගාලුකුලසූරියගේ ජසින්තා රෝස් ශ්‍රියානි පෙරේරා ජයවර්ධන වන අප විසින් කඳාන, මීගමුව පාර, අංක 100 හි පදිංචි එන්. එෆ්. වර්නන් කුරේ ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් 2019.07.09 දින සහතික කරන ලද වජ්ජක්කාර කංකානම්ගේ ඇලෙක්සැන්ඩර් සුසිත් නොහොත් වික්‍රමඩයස් වෙත ප්‍රදානය කරන ලද බත්තරමුල්ල රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවේ 281 වන කාණ්ඩයේ 130 පත්ඉරුවේ, අංක 12472 දින පොත් අංක යටතේ 2019.07.31 දින ලියාපදිංචි කර ඇති අංක 6792 දරන සාමාන්‍ය ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කළ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ එහි පොදු මහජනතාව වෙත මෙයින් දන්වා සිටිමු.

වජ්ජක්කාර කංකානම්ලාගේ එඩ්මන්ඩ් අජිත් ප්‍රසන්න ඩයස්,
ගාලුකුලසූරියගේ ජසින්තා රෝස් ශ්‍රියානි පෙරේරා ජයවර්ධන.

2022 මැයි මස 08 වැනි දින.

05-201

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම පිළිබඳ දැනුම් දීමයි

කරන්දෙණිය, මඩකුඹුර, 5 කණුව, අංක 58/3 හි පදිංචි බොළඳ හේවගේ ඉන්ද්‍රා ජයලත් (ජා. හැ. අ. 695701454 V) වන මා විසින් කරන්දෙණිය, මඩකුඹුර, 5 කණුව හි පදිංචි හපුතන්ත්‍රිගේ විජේසේන ලයනල් (ජා. හැ. අ. 720223724 V) යන අයට මා වෙනුවෙන් සහ මාගේ නමින් ක්‍රියා කිරීම සඳහා පත්කරමින් වර්ෂ 2014 ක් වූ දෙසැම්බර් මස 15 වැනි දින සයිප්‍රස් හි ශ්‍රී ලංකා කොන්සලේට් කාර්යාලයේදී මා විසින් අත්සන් කර කොන්සලේට් කාර්යාල කළමනාකාර ඩෙස්පිනා කොන්ස්ටන්ඩිනෝව් මහත්මිය විසින් සහතික කළ රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවේ දකුණු කලාප කාර්යාලයේ ලිඛිත බලධාරිකම් හා ඇටර්නි බලපත්‍ර පොතේ 56 කාණ්ඩයේ 12 වන පත්ඉරුවේ 5364 දරන දින පොත් අංක යටතේ ලියා පදිංචි කරන ලද ඇටර්නි බලපත්‍රය මෙතැන් පටන් අවලංගු කොට අහෝසි කොට බලරහිත කළ බවට සියලු දෙනාගේ දැන ගැනීම පිණිස මෙයින් දැනුම් දෙනු ලැබේ.

බොළඳ හේවගේ ඉන්ද්‍රා ජයලත්.

අංක 58/3, 5 කණුව,
මඩකුඹුර, කරන්දෙණිය.

05-202

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## සෙලාන් බැංකුව පීඑල්සී - ඇඹිලිපිටිය ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම දේපළ ඇඹිලිපිටිය සිය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති සහ යොමුව පී. වී. 75536 යටතේ 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකාව තුළ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන පී. බී. ප්‍රේමදාස ඇන්ඩ් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් සහ ඇඹිලිපිටිය පදිංචි පල්ලේවෙල බඳනගේ ප්‍රේමදාස යන අය බන්ධනදයී/උකස්කරු වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුව වෙත සුරක්ෂිත කර ඇත.

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොළොන්න කෝරළේ, දියපොතගම් පත්තුවේ, ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ පල්ලේගම ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ ඇඹිලිපිටිය, පල්ලේගම සහ උඩගම ගම්වල පිහිටි බලයලත් මිනින්දෝරු පී. ඩබ්ලිව්. කේ. මනම්පේරි විසින් සාදන ලද 2010.07.25 දිනැති අංක 4500 සැලැස්මේ නිරූපනය වන ගලකුඹුර නමැති සම්පූර්ණ බිම, ගස් වගා ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් අංක 2 ලකුණු කළ ඉඩම රූඩ් එකයි පර්චස් පහළොවක් (රූ. 1, පර්. 15) සහ හෙක්ටයාර් 0.0379 කට සමාන විශාල ඉඩම.

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොළොන්න කෝරළේ, දියපොතගම් පත්තුවේ, ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ පල්ලේගම ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ ඇඹිලිපිටිය, පල්ලේගම සහ උඩගම ගම්වල පිහිටි බලයලත් මිනින්දෝරු පී. ඩබ්ලිව්. කේ. මනම්පේරි විසින් සාදන ලද 2010.07.25 දිනැති අංක 4500 සැලැස්මේ නිරූපනය වන ගලකුඹුර නමැති සම්පූර්ණ බිම, ගස් වගා ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් අංක 3 ලකුණු කළ ඉඩම පර්චස් හතරයි දශම පහක් (පර්. 4.5) සහ හෙක්ටයාර් 0.0114 කට සමාන විශාල ඉඩම.

ඉහත සඳහන් දේපළ **2022 ජුනි මස 17 වැනි දින පෙරවරු 11.30 ට** සෙලාන් බැන්ක් පීඑල්සී ඇඹිලිපිටිය ශාඛා පරිශ්‍රයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ පිවිසීම.* - ඇඹිලිපිටිය නගරයේ පිහිටි ඔරලෝසු කණුව අසල සිට කොළඹ පාර ඔස්සේ රත්නපුර දෙසට මීටර් 750 ක පමණ දුරක් ගිය විට ඇඹිලිපිටිය සුපර්සිටි නමැති අදාළ දේපළ ප්‍රධාන මාර්ගයට මුහුණ ලා පිහිටා ඇත.

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පනවන ලද කෝවිඩ් 19 උපදෙස් සහ නීති රීතිවලට අනුකූලව මෙම වෙන්දේසිය පවත්වනු ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.* - රජයේ ගැසට් පත්‍රයේ 2021.02.12 වැනි දින පළ වී ඇති අතර, අද, ඩේලිමිරර් සහ ටැමිල් මිරර් යන පුවත්පත්වල 2020.12.07 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 3,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 1,500 , 6. සියලුම ප්‍රචාරක වියදම්, 7. ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතුයි.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

*හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න.*- නීති ප්‍රධානී සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක 011 2456460, 011 - 2456472.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත් කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකතන අංක : 011- 3068185, 011- 2572940.

05-172

**මහජන බැංකුව - ආයතනික බැංකු අංශය**

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 (ඇ) වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

*දේපළ විස්තරය.-*

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරලේ, අදිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය සභාවේ, බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 282 කඳුබොඩ ග්‍රාම නිලධාරි වසමේ කඳුබොඩ පිහිටි ''කරඳගොල්ලවත්ත'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. කේ. මහින්ද විසින් 2014 සැප්තැම්බර් මස 03 වැනි දින මැන සාදන ලද අංක 5881 දරන පිඹුරේ ලොට් A දරන ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ N 247/101 යටතේ ලියාපදිංචි කර ඇත.

*ඉඩමේ ප්‍රමාණය :* ප්‍රමාණයෙන් පර්චස් විස්සයි දශම හතරයි බින්දුව (පර්. 20.40) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ ගොඩනැගිලි ආදී සියල්ල වේ.

මහජන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් **2022 ජූනි මස 15 වැනි දින පෙ. ව. 11.30 ට** දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*වැඩි විස්තර සඳහා. -* 2020.08.28 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ ද, 2020.08.28 වැනි දින දිනමිණ, ඩේලිනිවුස් සහ තිනකරන් පුවත්පත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.-* දෙල්ගොඩ හන්දියේ සිට බියගම මාර්ගය ඔස්සේ (මහනුවර අලුත් පාර) කි. මී. 1ක් පමණ දුරක් පැමිණ සියඹලාපේ කණිෂ්ට පාසල් ක්‍රීඩා පිටිය පසුකරනවාත් සමගම වම් අත දෙසට ඇති කොන්ක්‍රීට් දමා ඇති ප්‍රාදේශීය සභා පාර දෙසට හැරෙන්න. එම මාර්ගය ඔස්සේ මීටර් 400ක් පමණ පැමිණ ''ලුක්‍රේටිව් ගාර්ඩන්'' යනුවෙන් හඳුන්වනු ලබන දේපල වෙන්දේසි ඉඩම් කොටස දෙසට ඇති වම් අත පැත්තෙන්වූ අඩි 30ක් පළල කොන්ක්‍රීට් පාර දෙසට හැරී T අක්ෂරයේ හැඩය ඇති හන්දිය දක්වා මීටර් 75ක් පමණ ගමන් කර වමට හැරී තවත් මීටර් 20ක් පමණ පැමිණි විට වම් අත පැත්තේ කෙළවරේ මෙම ඉඩම හමුවනු ඇත.

*ගෙවීමේ ක්‍රමය. -*

1. ගැණුම් මිලෙන් 10%ක් ද,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% දේශීය විකුණුම් බද්ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක් ද,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 1,000 ක් ද,
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
6. විකුණුම් සහතිකයට අදළ මුද්දර ගාස්තු ද.

ගැණුම් මිලෙන් 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත සහකාර සාමාන්‍යාධිකාරි (අයකිරීම්), මහජන බැංකුව, අයකිරීම් දෙපාර්තමේන්තුව, ප්‍රධාන කාර්යාලය, අංක 75, 10 වැනි මහළ, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02, ලිපිනයට ගෙවිය යුතු ය.

දුරකතන අංක : 011 2481613, 011 2334281
ෆැක්ස් අංකය : 011 2324958

හිමිකම් ඔප්පුව සහ වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කරන ලද මුදල් දින තිහක් (30)ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතියක් ඇත.

ඉහත වෙන්දේසියට පෙර දැනුම්දීමකින් තොරව නැවැත්වීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුය.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු/සාමවිනිසුරු (මුළු දිවයිනට ම).

අංක 11/55, බෝගහවත්ත,
කුඩාබුත්ගමුව, අංගොඩ.
දුරකථන අංක : 011 2053286/072 - 3207533
076 9217329.

05-174

---

**ඩී. එෆ්. සී. සී. බැන්ක් (පී.එල්.සී.)**

1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන වෙන්දේසිය

**දඹුල්ල පාදෙණියේ දඹුල්ල පාරේ පිහිටි ගොඩනැගිල්ලක් සහිත ඉඩමක් වෙන්දේසියේ විකිණීම**

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, වගපනහ පල්ලේසිය පත්තුවේ දඹුල්ල මහ නගර සභා සීමාව තුළ පොහොරනන්වැව

ග්‍රාම නිලධාරි වසමේ පාදෙණිය ග්‍රාමයේ පිහිටියාවූ ''දෙමළි දවාපු යාය'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. බී. නවරත්න විසින් 2013 දෙසැම්බර් මස 05 වැනි දින මැන සකස් කරන ලද අංක 2433 දරන පිඹුරේ නිරූපිත කැබලි බෙද වෙන් කර ඇති ලොට් අංක C දරන ඉඩම් කොටස.

ටී. එම්. ගුණසිංහ විසින් 2019 ජනවාරි මස 11 වැනි දින සහතික කරන ලද අංක 1097 දරන උකස්කරය ද, ප්‍රසිද්ධ නොතාරිස් පී. ඩබ්ලිව්. එන්. කේ. හීන්කෙන්ද විසින් සහතික කරන ලද පිළිවෙලින් 2015 මාර්තු මස 24 වැනි දින, 2016 මාර්තු මස 28 වැනි දින, 2017 ජනවාරි මස 10 වැනි දින, 2017 ජූලි මස 19 වැනි දින සහතික කරන ලද DFCC Bank PLC (Successor to DFCC Vardhana Bank PLC) නමට ලියන ලද්දවූ ද, පිළිවෙලින් අංක 2609, 2880, 3058, සහ 3170 දරන බැඳුම්කරයන් මත අයවිය යුතු මුදල ගෙවීමට මානෙල් පුරගේ දර්ශන වර්ණ ඉන්ද්‍ර කුමාර ජයලත් ණයකරු වශයෙන් පැහැර හැර ඇති බැවින් රූඩ් 3 පර්. 35 (අ.0, රූ. 3, පර්. 35) *නොහොත්* හෙක්ටයාර් 0.3921

DFCC Bank PLC විසින් මා වෙත පවරන ලද බලය මත **2022 ක් වූ ජූනි මස 24 වැනි දින පෙ. ව. 11.30** ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා 2021.02.25 වැනි දින ශ්‍රී ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රය* ද, 2021.02.09 වැනි දින දිනපතා ''දිවයින'' ''දි අයිලන්ඩ්'' ''තිනක්කුරල්'' යන පුවත්පත් බලන්න.

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් "COVID 19" වසංගතය සම්බන්ධයෙන් නිකුත් කර ඇති නිර්නායකයන්ට අනුකූලව මෙම වෙන්දේසිය පවත්වනු ලැබේ.

*දේපළට ප්‍රවිශ්ඨ වන මාර්ගය.-* දඹුල්ල නගරයේ හෝරා ස්ථම්භය අසළ සිට කුරුණෑගල පාරේ කි. මී. 3 3/4 පමණ යුරෝ නිපෝන් ලංකා ප්‍රදර්ශනාගාරයේ පරිශ්‍රයේ උතුර කෙළවර දක්වා ගමන් කිරීමෙන් යුරෝ නිපෝන් ලංකා ආයතනය ඉදිරිපිට දකුණු පසින් මෙම දේපළ පිහිටා ඇත.

වෙන්දේසිය අවසානයේදී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවෙලේම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි. (1) ගැණුම් මුදලින් 10%ක් ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2% ක් සහ ඒ මත අයවිය යුතු බදු ද, (4) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද, (5) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 1,500 ක් ද, (6) විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු වශයෙන් රු. 3,000ක් ද, විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු ද වේ. ගැණුම් මිළේ ඉතිරි 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතු වන අතර ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද ගෙවිය යුතු යි.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 02, ඩබ්ලිව් ඒ ඩී රාමනායක මාවතේ අංක 73, DFCC බැන්ක් හි ණය සම්බන්ධීකරණ කළමණාකරු ණය පුනරුත්ථාපන සහ අයකිරීම් ගෙන් විමසන්න.

දුරකථන අංක : 011 2371371.

පෙර දන්වීමකින් තොරව මෙම වෙන්දේසිය අත්හිටුවීමට/අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතුව ඇත.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස් තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

134 බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක : 2873656, 0777 672082, ෆැක්ස් අංකය :2871184.

05-176

---

**මහජන බැංකුව - කඩවත ශාඛාව**

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 (ඈ) වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ (වඩා නිවැරදිව සියනෑ කෝරළේ අධිකාරි පත්තුවේ) මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 287 සී, කිරිල්ලවල බටහිර ග්‍රාම නිලධාරි වසමේ මහර ප්‍රාදේශීය සභා සීමාව තුළ කිරිල්ලවල ග්‍රාමයේ පිහිටි මිල්ලගහ වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. පී. වික්‍රමසිංහ මහතා විසින් 2009.06.01 දින මැන සාදන ලද අංක 3352 දරන පිඹුරේ ලොට් අංක 01 දරන ඉඩම ප්‍රමාණයෙන් පර්චස් විසි දෙකක් වූ ( පර්. 22) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ පළතුරු ගොඩනැගිලි ඇතුළු මාර්ග අයිතිය ද වේ.

මහජන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් **2022 ජූනි මස 28 වැනි දින පෙ.ව. 11.30** දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය COVID 19 ක්‍රියා පිළිවෙලට අනුගත වෙමින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව ම පවත්වනු ලැබේ.

*වැඩි විස්තර සඳහා .* - 2018.06.01 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ ද*, 2018.05.15 වැනි දින දිනමිණ, ඩේලිනිවුස් සහ තිනකරන් පුවත්පත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.* - කොළඹ නගරයේ සිට මහනුවර ප්‍රධාන මාර්ගය ඔස්සේ කි. මී. 20.2 පමණ දුරක් ඉදිගහමුල හන්දිය දක්වා ගමන් කරන විට ඔබගේ වම් පසින් ඇති බස්නැවතුම අසල ඇති ඉන්ධන පිරවුම්හල ඉදිරිපිට ඔබට මෙම ඉඩම දිස්වනු ඇත.

*ගෙවීමේ ක්‍රමය.* -

1. ගැණුම් මිලෙන් 10%ක් ද,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% දේශීය විකුණුම් බද්ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක් ද,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 1,000 ක් ද,
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
6. විකුණුම් සහතිකයට අදළ මුද්දර ගාස්තු ද.

ගැනුම් මිලෙන් 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත ප්‍රධාන කළමනාකරු (අයකිරීම්), මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, අංක 131, නුවර පාර, බැලුම්මහර, මුදුන්ගොඩ යන ලිපිනයට ගෙවිය යුතු ය.

දුරකතන අංක : 033 2223880, 2225008, 2226909
ෆැක්ස් අංකය : 033 - 2226165

හිමිකම් ඔප්පුව සහ වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කරන ලද මුදල් දින තිහක් (30)ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතියක් ඇත.

ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු සාමවිනිසුරු (මුළු දිවයිනටම)

අංක : 11/55, බෝගහවත්ත,
කුඩාබුත්ගමුව, අංගොඩ.
දුරකථන අංක : 011 2053286/072 - 3207533
076 9217329.

05-177

**මහජන බැංකුව - ලිබර්ටි ප්ලාසා ශාඛාව**

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 වන (ඇ) වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව ඇතුළත තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැල්ලවත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ වැල්ලවත්තේ පිහිටා ඇත්තාවූ ද, 43 වන වෙලුමේ 89 වන පත්තිරුවේ සිට 71 වන වෙලුමේ 281 වන පත්තිරුව දක්වා ලියාපදිංචි වී ඇති (වැල්ලවත්ත) අංක 2 දරන ලියාපදිංචි පිඹුරේ ලොට් FID හි උපබෙදීමක් වන රාමක්‍රිෂ්ණ පාරේ වරිපනම් අංක 35 දරන සහ ''මහවැල්ලවත්ත'' යනුවෙන් හඳුන්වන ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ඒ. පී. එස්. ගුණවර්ධන විසින් සාදන ලද 1978.08.28 දින අංක 1000 දරන පිඹුරේ ලොට් FIDA දරන ඉඩම ප්‍රමාණයෙන් පර්චස් තිස්හතයි දශම තුනයි බිංදුවක් වූ (අ. 0, රූ. 0, පර්. 37.30) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ පළතුරු ගොඩනැගිලි සමග මාර්ග අයිතිය ද වේ.

ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ASPE106/84 සහ දැන් SPE 139/138 දරන හිමිකම් වෙලුම් පත්තිරුව යටතේ ලියාපදිංචි වී ඇති ඉහත කී ලොට් FIDA

මහජන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් **2022 ජුනි මස 23 වැනි දින පෙ. ව. 11.30** ට මහජන බැංකුව ලිබර්ටි ප්ලාසා ශාඛාව පරිශ්‍රයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය COVID 19 ක්‍රියා පිළිවෙලට අනුගත වෙමින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව ම පවත්වනු ලැබේ.

*වැඩි විස්තරසඳහා .* - 2020.09.04 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද, 2020.09.04 වැනි දින දිනමිණ, ඩේලිනිවුස් සහ තිනකරන් පුවත්පත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.* - කොළඹ කොටුව සිට කොළඹ හම්බන්තොට වැල්ලවාය A2 අධිවේගී මාර්ගය ඔස්සේ කිලෝ මීටර් 7.6 දුරින් දකුණු අත දිසාවට රාමක්‍රිෂ්ණ පාර පිහිටා ඇත. එතැන් සිට මීටර් 250ක් පමණ දුරින් වම් අත දිසාවේ මෙම ඉඩම පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* -

1. ගැණුම් මිලෙන් 10%ක් ද,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% දේශීය විකුණුම් බද්ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක් ද,

4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 1,000 ක් ද,
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
6. විකුණුම් සහතිකයට අදාළ මුද්දර ගාස්තු ද.

ගැනුම් මිලෙන් 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත ප්‍රධාන කළමනාකරු (අයකිරීම්), මහජන බැංකුව, අයකිරීම් දෙපාර්තමේන්තුව, ප්‍රධාන කාර්යාලය, අංක 75, 10 වැනි මහළ, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02, ලිපිනයට ගෙවිය යුතු ය.

දුරකතන අංක 011- 2481569, 011- 2481331
ෆැක්ස් අංකය : 011- 2431033

හිමිකම් ඔප්පුව සහ වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කරන ලද මුදල දින තිහක් (30)ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතියක් ඇත.

ඉහත වෙන්දේසියට පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු, සාමවිනිසුරු (මුළු දිවයිනට ම)

අංක 11/55, බෝගහවත්ත,
කුඩාබුත්ගමුව, අංගොඩ.
දුරකථන අංක : 011 2053286/072 - 3207533
076 9217329.

05-178

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

බ්ලැක්පූල් එකෝ විලා (ප්‍රයිවට්) ලිමිටඩ්.
ගිණුම් අංක : 1213 1401 0125 සහ 5213 3000 0376.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර, 2019.05.30 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් තුන් කෝටි පන්ලක්ෂ හැත්තෑ නමදහස් දෙසිය තිස් හතරයි ශත පනස් හයක (රු. 30,579,234.56) මුදල ද, 2019 මැයි මස 10 වැනි දින සිට අංක 1212 සහ 2722 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දෙකෝටි තිස් නම ලක්ෂ පනස් දහසක (රු. 23,950,000) මුදලක් සඳහා at the rate of Average Weighted Prime Lending Rate + Three per Centum (3%) Per annum හා තවත් ශ්‍රී ලංකා මුදලින් රුපියල් පනස් හතර ලක්ෂ විසි නම දහස් හයසිය අසූ හතයි ශත පනහක (රු. 5,429,687.50) මුදලකට සමාන ඇමෙරිකානු එක්සත් ජනපද වලංගු මුදලින් ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් තිස් එක් දහස් දෙසිය පනහක (US$ 31,250) මුදලක් සඳහා at the rate of 03 Months London Inter Bank Offered Rate + Four Per centum (4%) Per annum (minimum 5.5%) බැගින් වූ පොළිය ද, දන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2019.08.09 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2019.07.25 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි **2022.06.16 පෙ. ව. 11.30** ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

1. මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, ඔයපළාත කෝරළේ, නුවරඑළිය ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ කොට්ඨාසයේ, ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ බ්ලැක්පූල් ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ බ්ලැක්පූල් ග්‍රාමයේ පිහිටි ඉඩමට බලයලත් මානක තැන එන්. ලියනගේ යන අය විසින් සාදන ලද 2015 දෙසැම්බර් 07 දා තම හා අංක 1471 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 2 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ආර් සී විලියම් සහ බෙනඩික්ට් පෙරේරා විසින් හිමිකම් කියනු ලබන ඉඩම, නැගෙනහිරට : බෙනඩික්ට් පෙරේරා එස් ඒ. සී. පෙරේරා විසින් හිමිකම් කියනු ලබන ඉඩම, දකුණට : ලොට් 2A (එස්. ඒ. එස්. චන්ද්‍රවංස විසින් හිමිකම් කියනු ලබන ඉඩම) සහ බස්නාහිරට : පාර සහ අඩි පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් හතක් (A: 0, R: 0, P: 37) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක. 1471 දරන පිඹුරට අනුව ය.

අංක 1471 දරන පිඹුරේ එකී ලොට් 2 පහතින් මැනවින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

එකී බ්ලැක්පූල් ග්‍රාමයේ පිහිටි ඉඩමට බලයලත් මානක තැන වයි. කේ. ඩී. ඒ. සේනාරත්න යන අය විසින් සාදන ලද 1995

දෙසැම්බර් 18 දාතම හා අංක 550 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් 2 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ආර්. සී. විලියම්ස් විසින් හිමිකම් කියනු ලබන ඉඩම, නැගෙනහිරට : බෙනඩික්ට් පෙරේරා එස්. ඒ. සී. පෙරේරා විසින් හිමිකම් කියනු ලබන ඉඩම, දකුණට : එස්. ඒ. එස්. චන්ද්‍රවංස විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ බස්නාහිරට : අඩි පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් හතක් ( P: 37) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සැම සියලු දේ සමග එකී අංක. 550 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව A 180/107 යටතේ නුවරඑළිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

2. එකී බිලැක්පූල් ග්‍රාමයේ පිහිටි ඉඩමට බලයලත් මානක තැන එන්. ලියනගේ යන අය විසින් සාදන ලද 1995 දෙසැම්බර් මස 07 දාතම හා අංක 1471 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 2A වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම පිඹුරේ ලොට් 2 (එන්. කේ. එම්. දිසානායක විසින් හිමිකම් කියනු ලබන ඉඩම), නැගෙනහිරට : එස්. ඒ. සී. පෙරේරා විසින් හිමිකම් කියනු ලබන ඉඩම, දකුණට : පාර, සහ බස්නාහිරට : පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් හතක් (P: 37) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සැම සියලු දේ සමග එකී අංක 1471 දරන පිඹුරට අනුව ය.

අංක 1471 දරන පිඹුරේ එකී ලොට් 2A පහතින් මැනවින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

එකී බිලැක්පූල් ග්‍රාමයේ පිහිටි ඉඩමට බලයලත් මානක තැන වයි. කේ. ඩී. ඒ. සේනාරත්න යන අය විසින් සාදන ලද 1995 දෙසැම්බර් 18 දාතම හා අංක 550 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 2A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එන්. කේ. එම්. දිසානායක විසින් හිමිකම් කියනු ලබන ඉඩම නැගෙනහිරට : එස්. ඒ. සී. පෙරේරා විසින් හිමිකම් කියනු ලබන ඉඩම, දකුණට : පාර සහ බස්නාහිරට : අඩි පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් හතක් ( P: 37) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සැම සියලු දේ සමග එකී අංක 550 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව A 180/108 යටතේ නුවරඑළිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

05-148

**මහජන බැංකුව - හිඟුරක්ගොඩ ශාඛාව (006)**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 වසරේ අංක 29 දරන මහජන බැංකු පනතෙහි 29 ඩී වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සිංහල පත්තුවේ සුළු කොට්ඨාසයේ, හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ හිඟුරක්ගොඩ (පුලතිසිගම) නමැති ගමේ අංක 79 - බෝපුර ග්‍රාම නිලධාරි වසමේ පිහිටි හිඟුරක්දමන යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු අයි. එච්. එම්. එස්. ජේ. බී. හේරත් මහතා විසින් 2009.11.25 වැනි දින මැන සාදන ලද අංක 259 දරන පිඹුරේ ලොට් අංක 01 දරන බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : පර්. 12.22

එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ සියල්ල සහිතව පොළොන්නරුව ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ අංක G/6/110 යටතේ ලියාපදිංචි කර ඇත.

මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් **2022 ජූනි මස 16 වැනි බ්‍රහස්පතින්ද දින පෙ. ව. 11.00 ට** මහජන බැංකුව, හිඟුරක්ගොඩ ශාඛා (006) පරිශ්‍රයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය COVID -19 ක්‍රියා පිළිවෙලට අනුගත වෙමින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලවම පවත්වනු ලැබේ.

*තීරණය පිළිබඳ දැන්වීම.* - කරුණාකර 2021.03.26 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, දිනමිණ, ඩේලි නිව්ස් සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

*දේපළ වෙත පිවිසීම.* - හිඟුරක්ගොඩ නගරයේ සිට කිලෝ මීටර් 2ක් පමණ ගුවන්තොටුපළ පාරේ ගමන් කළ පසු බෞද්ධ මධ්‍යස්ථානය අසලින් වමට ඇති හිඟුරක්ගොඩ පරණ උසාවිය පාරේ මීටර් 200ක් පමණ ගමන් කළ විට අදාළ දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැනුම් මිලෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2 (සියයට දෙකහමාර) සහ කොමිස් මුදල මත අදාළ බදු,
4. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,500.00,
5. අලෙවිය සඳහා වූ පිරිවැය සහ අනෙකුත් ගෙවීම් පවතී නම් එම ගෙවීම්,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු.

ගැණුම් මිලෙන් 90% (සියයට අනූව) ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ප්‍රාදේශීය කළමණාකරු, මහජන බැංකුව, ප්‍රාදේශීය මහලේකම් කාර්යාල සංකීර්ණය, නව නගරය, පොළොන්නරුව වෙත ගෙවිය යුතු වේ.

දුරකථන අංක : 027 2226626, 027 - 2224404

ෆැක්ස් අංකය : 027 - 2223522

ඉහත සඳහන් කළ පරිදි දින 30ක් ඇතුළත ඉහත සඳහන් කරන ලද මුළු මුදල ගෙවනු නොලැබුවහොත් දැනටමත් ගෙවනු ලැබ ඇති විකුණුම් මිලෙන් 10% ක මුදලක් බැංකුව සන්තක කිරීමේ සහ දේපළ නැවත වෙන්දේසි කිරීමේ බලය බැංකුව සතු වේ.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් අදාළ විස්තර ඉහත කී ලිපිනයෙන් ලබාගත හැක.

''ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතාගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි''.

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක් එකම වෙන්දේසිකරුවෙක්,
වසර 130 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය :*
6 A, ෆෙයාර්ෆීල්ඩ් ගාර්ඩන්ස්,
කොළඹ 08
දුරකථන අංක : 011-2671467, 011- 2671468
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2671469
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

05-156

---

**පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී.එල්.සී.**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ **වර්ෂ 2022 ක්වූ ජුනි මස 15 වැනි දින පෙරවරු 11.00 ට** එකී දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාම්පුරිය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කල්පිටිය ප්‍රාදේශීය සභා සීමාවේ, කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කල්පිටිය කොට්ඨාසයේ, අක්කරෙයිපත්තු උතුරේ මාම්පුරිය ග්‍රාමයේ පිහිටි විටාඩිතෝට්ටම් නමැති සහ බලයලත් මිනින්දෝරු එස්. මරියතාස් විසින් මැන සාදන ලද 2016.06.26 දිනැති අංක KP/914 දරන පිඹුරේ ලොට් 01 යනුවෙන් දැක්වෙන (පුත්තලම බලයලත් මිනින්දෝරු වී. ටී. බාලසුබ්‍රමනියම් විසින් මැන සාදන ලද 1996.11.15 දිනැති අක 923 දරන පිඹුරේ ලොට් 01 හි නැවත මැනීමක් වන) ඉඩම සහ ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ එහි පිහිටි සියලු දෙය වේ.

විශාලත්වය රූ. 1, පර්. 26.05

පුත්තලම ප්‍රසිද්ධ නොතාරිස් එච්. එන්. නවාවි විසින් සහතික කරන ලද වර්ෂ 2018.02.09 දිනැති අංක 9768 දරන ප්‍රාථමික උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම වර්ණකුලසූරිය පෝරුතොටගේ ජූඩ් ලලිත් නිශාන්ත ප්‍රනාන්දු යන අය ''බන්ධනදායි/උකස්කරු වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද,

යෝජනා සම්මුති පිළිබඳ නිවේදනය සඳහා වර්ෂ 2020 ජනවාරි මස 03 වැනි දිනැති රජයේ *ගැසට් පත්‍රය* සහ වර්ෂ 2019 දෙසැම්බර් මස 20 වැනි දිනැති දිවයින, ද අයිලන්ඩ් සහ තිනක්කුරල් පුවත්පත් ද බලන්න.

*ඉහත කී දේපළට පිවිසෙන මාර්ගය.* - පලාවිය මංසන්ධියෙහි සිට (පුත්තලම - කොළඹ මහපාර) කල්පිටිය පාර ඔස්සේ කිලෝ මීටර් 12ක් පමණ මාම්පුරි හන්දිය දක්වා පැමිණ (12 වන කිලෝ මීටර් කණුව පසුකරත්ම) වෙරළ පාරට හැරී මීටර් 75ක් පමණ ගමන් කළ යුතු ය. විෂයගත දේපළ පාරට මුහුණ ලා වම්පසින් පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* -

1. ගැණුම් මුදලෙන් 10%ක් ද (සියයට දහයක්),
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද (සියයට එකයි) සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2.5%ක් ද, (සියයට දෙක හමාරක්),
4. විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද,
5. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද (රු. 3,000).

වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගැනුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුව ගෙවිය යුතු ය. එකී 90%ක ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ හිමිකම් ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාළ තොරතුරු සඳහා කළමණාකරු ණය අය කරගැනීම්

අංශය, පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී. ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාළු පාර, කොළඹ 03.

දුරකථන අංකය : 011 4667229.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
බලයලත් වෙන්දේසිකරු,

අංක 369/1, දුටුගැමුණු මාවත,
මාවිල්මඩ, මහනුවර.
දුරකතන අංක : 081 2210595, 071 8446374.

05- 188

---

### සෙලාන් බැංකුව පීඑල්සී - මාතර බසාර් ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මාතර පදිංචි බුද්ධික ලියන ගුණවර්ධන යන අය බැඳුම්කරු/ උකස්කරු වශයෙන් ප්‍රසිද්ධ නොතාරිස් W. O. S. විතානන්ද විසින් සහතික කරන ලද 2016.11.30 දිනැති බැඳුම්කර අංක 1462 මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත සුරක්ෂිත කර ඇති මෙහි පහත සඳහන් උපලේඛනයේ සඳහන් දේපළ,

වර්ෂ **2022 ක් වූ ජූනි මස 22 වැනි දින පෙ. ව. 10.30 ට** සෙලාන් බැංකුව පීඑල්සී විසින් මා හට පවරණ ලද බලය ප්‍රකාරව මාතර බසාර් සෙලාන් බැංකු ශාඛා පරිශ්‍රයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID 19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

#### උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර මහ නගර සභා සීමාව, කඩවත් සතර සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කාර්යාලය තුළ, අංක 414 සී ඉසදීන් ටවුම ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ, හිත්තැටිය සහ වෙලේගොඩ ගම්වල පිහිටි අමිතා පාර වරිපනම් අංක 2593 දරන කහම්පලේ කුරුඳුවත්ත හෙවත් ඉසදීන් ටවුන් නමැති ඉඩමෙන් වෙන් කරන ලද යාව පිහිටි ලොට් 155 බී සහ 254 ලකුණු කළ සියලු ගස්, වගා, ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග බෙදා වෙන් කරන ලද යාබද ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් දහ අටයි දශම හතරයි අටක් ( පර්. 18.48) විශාල ඉඩම.

එකී යාබද ලොට් 155 බී සහ 254 බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ටී. එස්. විජයතිලක විසින් මැනකදී මැන 2016.02.14 දිනැති අංක 1230 සැලැස්ම සකස් කර ප්‍රමාණය පර්චස් දහඅටයි දශම හතරයි අටක් ( පර්. 18.48ක්) විශාල ලොට් 01 ලෙස නිරූපනය කර ඇත.

*දේපළට පිවිසීම.* - මාතර ගාළු පාරේ නූපේ හංදියෙන් අකුරැස්ස පාරෙන් කි. මී. 1 ඉසදීන් ටවුම දක්වා පැමිණ වමට ඇති මීරා පාරෙන් මීටර් 125ක් පළමු වටරවුම දක්වා පැමිණ දකුණු පසින් ඇති පාරෙන් මීටර් 50ක් ගොස් වමට ඇති යෙහිය පාරෙන් හැරී මීටර් 160ක් ගොස් අමිතා පාර දක්වා පැමිණෙන්න පසුව එම පාරෙන් මීටර් 20ක් ගිය පසු වම් පසින් වන්නට වරිපනම් අංක 03 ලෙස සඳහන් දේපළ වේ.

*යෝජනා සම්මුති දැන්වීම.*- 2022.03.18 දිනැති රජයේ *ගැසට් පත්‍රයේ* ද, 2022.03.16 ඩේලි මිරර්, අද තිනක්කුරල් පුවත්පත්හි ද පළ වේ.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේදී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

(1) ගැණුම් මිලෙන් 10%,
(2) පළාත් අධිකරියේ බදු සඳහා 1%,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2.5%
(4) විකුණුම් කොන්දේසි පත්‍රය සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,500,
(5) ලිපිකරු සහ සෝෂකගේ ගාස්තු,
(6) සම්පූර්ණ ප්‍රචාරණ පිරිවැය.

ගැණුම් මිලෙන් 90%ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, හෝ ගාස්තු වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවිය යුතු ය. ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාලසීමාව ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිනි නීති, සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාළු පාර, කොළඹ 03.

දුරකතන අංක : 011 - 2456494, 011- 2456479.

ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/ අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

චන්දිමා ප්‍රියදර්ශණී ගමගේ,
බලයලත් වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 09, අයි. හයිලෙවල් පාර,
සර්වෝදය මාවත, පනාගොඩ, හෝමාගම.
දුරකතන අංක : 071 4318252, 011- 2173282.

05-189

## සෙලාන් බැංකුව පීඑල්සී - කිරිඳිවැල ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 09 වන වගන්තිය යටතේ අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කිරිඳිවැල පදිංචි රත්නායක මොහොට්ටලාලගේ හේමන්ත පුෂ්පකුමාර රත්නායක යන අය බැඳුම්කරු/උකස්කරු වශයෙන් ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඩී. ටී. කේ. කළුආරච්චි විසින් සහතික කරන ලද 2017.12.19 දිනැති බැඳුම්කර අංක 1632 මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත සුරක්ෂිත කර ඇති මෙහි පහත උපලේඛනයේ සඳහන් දේපළ **වර්ෂ 2022 ක් වූ ජුනි මස 20 වැනි දින පෙ.ව. 10.30 ට** සෙලාන් බැංකුව පීඑල්සී විසින් මා හට පවරන ලද බලය ප්‍රකාරව කිරිඳිවැල සෙලාන් බැංකු ශාඛා පරිශ්‍රයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID 19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ සහ අත්තනගල්ල ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ සියනෑ කෝරළේ, ගඟබඩ පත්තුවේ දොම්පේ ප්‍රාදේශීය සභා සීමාව සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ මහලොලුව 387 ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ මහලොලුව පිහිටි බලයලත් මිනින්දෝරු එස්. එම්. චන්ද්‍රසිරි විසින් සාදන ලද 2005.06.13 වඩාත් නිවැරදිව 2005.05.13 දිනැති අංක 2988 සැලැස්මේ නිරූපනය වන වෙරලුගහලන්ද නමැති ඉඩමේ ලොට් 1 ලෙස ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් රූඩ් එකක් (රූ. 1) විශාල ගොඩනැගිලි ගස්, වගා, සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

*දේපළට පිවිසීම.* - කිරිඳිවැල නගරයේ සිට අත්තනගල්ල දෙසට කි. මී. 1.8 වම් පසින් ඇති කොහිලගල පාර දක්වා පැමිණ පසුව එම පාරෙන් මීටර් 300ක් ගොස් දකුණට ඇති කොන්ක්‍රීට් පාරෙන් මීටර් 150 ගිය පසු එම පාර සඳහා වෙන් කරන කොටසේ අවසානය වන්නට මෙම දේපළ පිහිටා ඇත. අඩි 10 පළල වූ පුද්ගලික පාර ප්‍රවේශ මාර්ගය වේ.

*යෝජනා සම්මුති දැන්වීම.*- 2022.03.18 දිනැති රජයේ ගැසට් පත්‍රයේ ද, ඩේලි මිරර්, අද, තිනක්කුරල් පුවත්පත්හි 2022.03.15 දින පළ වේ.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේදී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

(1) ගැණුම් මිලෙන් 10%,
(2) පළාත් අධිකරියේ බදු සඳහා 1%,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2.5%
(4) විකුණුම් කොන්දේසි පත්‍රය සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,500,
(5) ලිපිකරු සහ සෝෂකගේ ගාස්තු,
(6) සම්පූර්ණ ප්‍රචාරණ පිරිවැය.

ගැණුම් මිලෙන් 90%ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, හෝ ගාස්තු වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවිය යුතු ය. ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාලසීමාව ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිනි නීති, සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාළු පාර, කොළඹ 03.

දුරකතන අංක : 011 - 2456479, 011- 2456465.

ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/ අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

චන්ද්‍රිමා ප්‍රියදර්ශණී ගමගේ,
බලයලත් වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 09 - අයි. හයිලෙවල් පාර,
සර්වෝදය මාවත, පනාගොඩ, හෝමාගම.
දුරකතන අංක : 071 4318252, 011- 2173282.

05-190

---

## යූනියන් බැන්ක් ඔෆ් කළම්බෝ පී එල් සී

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 09 වන වගන්තිය ප්‍රකාරව වෙන්දේසිය පිළිබඳ දැන්වීමයි

කඩවත, දළුපිටිය, මිහිඳු මාවත අංක 162/02 දරන ලිපිනයෙහි පදිංචි කන්කානන් ගමගේ දොන් තිලකසිරි (ජා. හැ. අංක 590050318V දරන) සහ එකී ලිපිනයෙහි පදිංචි කන්කානන්ගමගේ දොන් පසන් ඉන්දීවර (ජා. හැ. අංක 943052050Vදරන) (මෙහි මින්මතු ඇතැම් තැනක "බන්ධනදායන්" වශයෙන් හඳුන්වන) යන අය විසින් සමාගම් ලියාපදිංචි කිරීමේ අංක PB 676PQ දරන යූනියන් බැන්ක් ඔෆ් කලම්බෝ පීඑල්සී (මෙහි මින්මතු යූනියන් බැංකුව වශයෙන් හඳුන්වන) වෙතින් මූල්‍ය පහසුකම් ලබාගෙන ඇති හෙයින්ද, එකී බන්ධනදායින් විසින් අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස් එස්. කේ. නදී ආකාශ් කුරේරා සහතික කරන ලද අංක 8836 සහ 2018.07.13 ප්‍රාථමික උකස් බැඳුම්කරය ලියා අත්සන් කොට තබා ඉහත කී මූල්‍ය පහසුකම් මත අයවිය යුතු මුදල සහ ඒ මත පොළිය ගෙවීම සඳහා ඇපයක් වශයෙන් මෙහි පහත උපලේඛනයන්හි සවිස්තරව දක්වා ඇති එකී දේපළ උකස් කොට ඇපයට තබා ඇති බැවින්ද, ඒ අනුව එකී

මුල්‍ය පහසුකම් මත 2020.09.17 වැනි දිනට හිඟ මුදල සහ මුල් හිඟ මුදල මත 2020.09.18 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් වැඩිදුර පොළියද, එකී බන්ධනදායිගෙන් යූනියන් බැංකුව වෙත ලැබිය යුතු සහ අයවිය යුතු බැවින්ද, යූනියන් බෑන්ක් ඔෆ් කලම්බෝ පීඑල්සි විසින් මා හට පවරා ඇති බලය ප්‍රකාරව

**1 වන වෙන්දේසිය 2022 ක් වූ ජුනි මස 17 වැනි දින පෙ. ව. 11.00 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.**

1 වන වෙන්දේසිය

### උපලේඛනය

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කනදර කෝරළයේ, අංක 277 දරන කුඩා නෙළුන්කුළම ග්‍රාම නිළධාරී වසමේ කුඩා නෙළුන්කුළම ගමේ පිහිටි "ගොඩ ඉඩම" නමැති ඉඩමට මිනුම්පති විසින් මැන සාදන ලද සහ අනුරාධපුර මිනුම් අධිකාරී භාරයේ තිබෙන අංක F. V. P. 268 දරන ඉඩම් කොටස් කිරීමේ අවසාන ගම් පිඹුරේ නිරූපිත ලොට් 346 වශයෙන් ලකුණු කරන ලද රජයේ ඉඩම ප්‍රමාණයෙන් හෙක්ටයාර බින්දුවයි දශම බින්දුවයි පහයි හතයි පහක් (හෙක් 0.0575) ක් විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි සෑම සියලු දේත් සමගය.

ඉහත කී ඉඩම මෑත කාලයේ සිදුකරන ලද මැනීමට අනුව පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කනදර කෝරළයේ, උපකොට්ඨාසයේ කුඩා නෙළුන්කුළම ගමේ පිහිටි "කුඩානෙළුන්කුළමමූකලාන" නමැති ඉඩමට අනුරාධපුර ජ්‍යෙෂ්ඨ මිනුම් අධිකාරී කේ. ජී. ජී. කරුණානායක විසින් මැන සාදන ලද 2018.05.24 වැනි දින සහතික කරන ලද අංක 268 දරන අවසන් ගම් පිඹුරේ අංක 11 දරන අතිරේකයේ අංක 13 දරන ක්ෂේත්‍ර පත්‍රයේ සත්‍ය උධෘතයේ නිරූපිත ලොට් අංක 346 වශයෙන් ලකුණු කරන ලද ඉඩම ප්‍රමාණයෙන් හෙක්ටයාර බින්දුවයි දශම බින්දුවයි පහයි හතයි පහක් (හෙක් 0.0575) ක් විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි සෑම සියලු දේත් සමග වන අතර මෙය අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ L. D. O. D. -29/34 යටතේ ලියා පදිංචි කර ඇත.

*දේපළට පිවිසීම :* අනුරාධපුර සිට නුවර පාර ඔස්සේ කුඩානෙළුම්කුළම දක්වා පැමිණි පසු නාච්චිදූව ජලාශයේ සිට නුවරවැව ජලාශය දක්වා දිවෙන පාරට මුහුණලා මෙම විෂයගත දේපළ පිහිටා ඇත.

**02 වන වෙන්දේසිය 2022.06.17 වැනි දින පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.**

2 වන වෙන්දේසිය

### උපලේඛනය

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කනදර කෝරළයේ, අංක 277 දරන කුඩා නෙළුන්කුළම ග්‍රාම නිලධාරී වසමේ කුඩා නෙළුන්කුළම ගමේ පිහිටි "ගොඩ ඉඩම" නමැති ඉඩමට මිනුම්පති විසින් මැන සාදන ලද සහ අනුරාධපුර මිනුම් අධිකාරී භාරයේ තිබෙන අංක F. V. P. 268 දරන ඉඩම් කොටස් කිරීමේ අවයන් ගම් පිඹුරේ නිරූපිත ලොට් 347 වශයෙන් ලකුණු කරන ලද රජයේ ඉඩම ප්‍රමාණයෙන් හෙක්ටයාර බින්දුවයි දශම දෙකයි බිංදුවයි දෙකයි නමයක් (හෙක් 0.2029 ක් විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි සෑම සියලු දේත් සමඟය.

ඉහත කී ඉඩම මෑත කාලයේ සිදුකරන ලද මැනීමට අනුව පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කනදර කෝරළයේ, උපකොට්ඨාසයේ කුඩා නෙළුන්කුළම ගමේ පිහිටි "කුඩානෙළුන්කුළම මූකලාන" නමැති ඉඩමට අනුරාධපුර ජ්‍යෙෂ්ඨ මිනුම් අධිකාරී කේ. ජී. ජී. කරුණානායක විසින් මැන සාදන ලද 2018.05.24 වැනි දින සහතික කරන ලද අංක 268 දරන අවසන් ගම් පිඹුරේ අංක 11 දරන අතිරේකයේ අංක 13 දරන ක්ෂේත්‍ර පත්‍රයේ සත්‍ය උධෘතයේ නිරූපිත ලොට් අංක 347 වශයෙන් ලකුණු කරන ලද ඉඩම ප්‍රමාණයෙන් හෙක්ටයාර බින්දුවයි දශම දෙකයි බිංදුවයි දෙකයි නමයයි (හෙක් 0.2029) ක් විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි සෑම සියලු දේත් සමග වන අතර මෙය අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ L. D. O. D. -29/30 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩම් සම්බන්ධ උකස්කරය නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් විසින් යොමු අංක Anu/8/5/4/Deepa/Pe/036884 සහ 12-07-20 දී දරන ලිපියෙන් අනුමත කර ඇත.

*දේපළට පිවිසීම :* අනුරාධපුර සිට නුවර පාර ඔස්සේ කුඩානෙළුම්කුළම දක්වා පැමිණි පසු නාච්චිදූව ජලාශයේ සිට නුවර වැව ජලාශය දක්වා දිවෙන ප්‍රධාන පාරට මුහුණලා මෙම විෂයගත දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියේ බදු සඳහා සියයට එකක් (1%), 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහක් (2.5%), 4. විකුණුම් කොන්දේසි පත්‍රය සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,500, 5. ලිපිකරු

සහ සෝෂකගේ ගාස්තු රු. 1,000, 6. සම්පූර්ණ ප්‍රචාරණ පිරිවැය සහ අනෙකුත් වියදම්

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු හෝ ගාස්තු වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත යූනියන් බැන්ක් ඔෆ් කලම්බෝ පීඑල්සී වෙත ගෙවිය යුතුය. ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාලසීමාව ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID 19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

*හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න. නීති දෙපාර්තමේන්තුව.* යූනියන් බැන්ක් ඔෆ් කළම්බෝ පීඑල්සී, අංක 64, ගාළු පාර, කොළඹ 03.

දුරකතන : 011-2347100.

චන්දිමා ප්‍රියදර්ශණී ගමගේ,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු,
උසාවි කොමසාරිස්.

අංක 9 - අයි, හයිලෙවල් පාර,
සර්වෝදය මාවත, පනාගොඩ හෝමාගම,
දුරකතන අංක : 0714318252 - 011-2173282.

05-191

---

## හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - මරදගහමුල ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් සී. දයාරත්න විසින් සහතික කරන ලද්දවූ ද, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දවූ ද, 2016 මාර්තු මස 30 වැනි දින සහතික කළ අංක 10668, 2016 ජුනි මස 24 වැනි දින සහතික කළ අංක 10893, 2017 අප්‍රේල් මස 25 වැනි දින සහතික කළ අංක 11775, 2017 අප්‍රේල් මස 25 වැනි දින සහතික කළ 11777 සහ 2017 සැප්තැම්බර් මස 28 වැනි දින සහතික කල අංක 12228 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම හේමන්ත මහානාග තල්පාවිල යන අය ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් සහ වෙන්දේසිකරුගේ ගාස්තුව ඇතුළු සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ එම දේපළ පිහිටි ස්ථානයේදී **2022 ක් වූ ජුනි මස 29 වැනි දින පෙ. ව. 10.30 ට** මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ලියාපදිංචි කොට්ඨාසය තුළ හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ, කඩුවෙල මහ නගර සභා සීමාව තුළ මාලබේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රග්ගහවත්ත අංක 474/ඒ ග්‍රාම නිලධාරී වසමේ හේවාගම් ගමේ හි පිහිටි කොළඹ පාරේ, වරිපනම් අංක 303/17 දරන ''ගොඩැල්ලවත්ත හෙවත් කෝන්ගහවත්ත සහ කෝන්ගහඕවිට'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. සී. ප්‍රේමචන්ද්‍ර විසින් 2003 පෙබරවාරි මස 02 වැනි දින සහ එම බලයලත් මිනින්දෝරු විසින් 2016 මාර්තු මස 22 වැනි දින නැවත සහතික කරන ලද අංක 2215 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 01 දරන ප්‍රමාණය පර්චස් දහයක් ( පර්. 10) විශාල ඉඩම සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

බලයලත් මිනින්දෝරු ජී. සී. ප්‍රේමචන්ද්‍ර විසින් 2002 සැප්තැම්බර් මස 02 වැනි දින මැන සාදන ලද අංක 2194 දරන පිඹුරේ ලොට් 01 වශයෙන් දැක්වෙන මාර්ගයේ එහා මෙහා ගමන් කිරීමේ අයිතිය සමග වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2018.07.20 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* ද, සහ 2018.11.02 වැනි දින ලක්බිම, ඩේලිමිරර් සහ තිනක්කුරල් පුවත්පත් බලන්න.

*ඉඩමට පිවිසීම.* - ඔරුගොඩවත්තේ සිට ඔරුගොඩවත්ත වැල්ලම්පිටිය කඩුවෙල පාරේ මීටර් 25ක් පමණ ගමන් කර කි. මී. 11 කණුව හමුවීමට පෙර දකුණට හැරුණු විට ඇති පාරක් සඳහා වෙන්කර ඇති අඩි 15ක් පළල බිම් කොටස ඔස්සේ මීටර් 125ක් ගමන් කර දකුණට හැරී එම පාරේ මීටර් 20ක් පමණ ගමන් කළ විට අදාළ දේපළ පාරේ වම් පැත්තේ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසන් වූ වහාම උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු යි. චෙක්පත් භාරගනු නොලැබේ.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
(02) ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකයි (1%),
(03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහයි (2.5%),
(04) විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව රු. 2,000,
(05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 1,500,
(06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්,

(07) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතු ය. දින 30ක් තුළ දී ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල ආපසු නොගෙවා අතර, දේපළ නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID -19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

හිමිකම් ඔප්පු හා අදාළ ලේඛන පරීක්ෂා කිරීමට සහ වැඩි විස්තර සඳහා :-

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 200, 2 වන මහල උසාවි පාර,
කොළඹ 12.
දුරකතන/ෆැක්ස් අංක : 011- 2445393
ඊමේල් : senaservice84@gmail.com

ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අයිකිරීම්),
හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී., අංක 479,
ටී. බී. ජයා මාවත,
කොළඹ 10.
දුරකතන අංක 011 - 2664664.

05-204

---

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව වෙන්දේසිය පිළිබඳ දැන්වීමයි

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දකුණු උඩුගහ කෝරළයේ, දඹදෙණි හත්පත්තුවේ, අලව්ව ප්‍රාදේශීය සභා සීමාව තුළ, අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පහළ කලල්පිටිය ග්‍රාම නිලධාරි වසමේ පහල කලල්පිටියේ පිහිටි කොළොන්ගහමුලහේන සහ මැටිවලමුල්ලහේන නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. එච්. එම්. බී. පෙරේරා විසින් මැන සාදන ලද අංක 2014/44 සහ 2014.03.17 දින දරන පිඹුරේ නිරූපිත ලොට් 1 වශයෙන් ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කොටස,
ප්‍රමාණය : අක්කර හතක් (අ. 7)

විශාල ඉඩම් කැබැල්ල සහ එහි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි, පළතුරු ආදී සෑම සියලු දේත් සමග ය.

තවද, එකී අංක 3866 දරන පිඹුරේ නිරූපිත ලොට් 4E සහ ලොට් 4 F (ගල් පර්වත සමන්විත) දරන ඉඩම් කැබලි මතින් ගමන් කිරීමේ පොදු මාර්ග අයිතිය ද සමගය.

ඉහත ඉඩම පහත සඳහන් ඉඩමේ නැවත මැන බෙදා වෙන් කිරීමක් වේ.

මුරුතළිඳහේන, හිටිනාවත්ත, කොළොන්ගහමුලහේන නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එල්. බී. බැද්දේවෙල විසින් මැන සාදන ලද අංක 3866 සහ 1978.12.31 දින දරන පිඹුරේ නිරූපිත ලොට් 4 M දරන ඉඩම. මෙය (දැනට නාරම්මල ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ) පෙර කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ U 57/114 දරන වෙළුම/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ප්‍රදීපා ප්‍රියදර්ශනී වික්‍රමතිලක විසින් සහතික කරන ලද අංක 1417 සහ 2014.10.13 අංක 1806 සහ 2015.10.12 අංක 2126 සහ 2016.09.20 දින දරන උකස් බැඳුම්කර මගින් සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඉෂාර දිළුම්ණි වීරක්කොඩි විසින් සහතික කරන ලද අංක 3047 සහ 2018.07.31 දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දැක්වෙන අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය, ඉහත කී **සී. එම්. පී. ප්‍රොඩක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්** ආයතනය විසින් ලබාගත් මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් බන්ධනදයි ලෙස ක්‍රියාකරමින් එකී සී එම් පී ප්‍රොඩක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් සහ උකස්කරු ලෙස ක්‍රියාකරමින් මාන්නනායක ආරච්චිගේ දෝන පුබදු මාන්නනායක යන අය විසින් (සී එම් පී ප්‍රොඩක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ අධ්‍යක්ෂවරයෙකු සහ කොටස් හිමියෙකු) කොළඹ 02, යූනියන් පෙදෙසේ, අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී නමින් උකස් කොට, ඇපයට තබා ඇති බැවින් ද, එකී බැඳුම්කර මගින් ඇප තබන ලද ඉහත කී මූල්‍ය පහසුකම් මත අයවිය යුතු මුදල් ගෙවා පියවා දැමීම ඉහත කී, සී එම් පී ප්‍රොඩක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් පැහැර හැරීම කර ඇති බැවින් ද නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී විසින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාරව,

උපලේඛනයේ දැක්වෙන දේපළ වර්ෂ **2022 ක් වූ ජුනි මස 28 වැනි දින පෙ. ව. 11.00 ට** අදළ දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - අලව්ව නගරයේ සිට නාරම්මල පාර ඔස්සේ මහරච්චිමුල්ල හන්දිය දක්වා කිලෝමීටර් 6ක් පමණ ගමන් කරන්න. ඉන් පසු වමට ඇති තාර පාරට හැරී එම පාරේ කිලෝමීටර් 1.8ක් ඉදිරියට ගමන් කරන විට අවසානයේ වමට ඇති බොරළු පාරට හැරෙන්න. (ප්‍රාදේශීය සභා පාර) එම පාරේ මීටර් 400ක් පමණ ඉදිරියට ගමන් කරන විට මෙම මාර්ගයට ඉහළින් දකුණු පැත්තේ මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීම් කළ යුතු ආකාරය.* - විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු යි.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
(02) ඉතිරි සියයට අනූව (90%) ගෙවීම ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුළත නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල් සී හි තැන්පත් කළ යුතු ය.
(03) පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
(04) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
(05) ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%,
(06) ලිපිකරු හා සෝෂක වේතනය රු. 1,500,
(07) නොතාරිස් ගාස්තුව සහ අනෙකුත් වියදම් රු. 3,500.

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID -19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

අනිකුත් තොරතුරු සඳහා පහත සඳහන් නිලධාරින්ගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
බලයලත් වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

කොළඹ වාණිජ මහාධිකරණ සහ දිසා අධිකරණය,
බලයලත් වෙන්දේසිකරු රාජ්‍ය සහ වාණිජ බැංකු,
අංක 200, හල්ස්ඩෝෆ් වීදිය, කොළඹ 12
දුරකථන අංක : 0773242954, 011- 445393

නීති දෙපාර්තමේන්තුව,
නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී,
අංක 242 යූනියන් පෙදෙස,
කොළඹ 02.
දුරකථන අංක : 011 4218742

05-205

---

**සෙලාන් බැංකුව පීඑල්සී - කෑගල්ල ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කෑගල්ල ''අලහකෝන් ස්ටෝර්ස්'' යන නාමය, විලාශය සහ අභිධානය යටතේ තනිස්වාමිත්වයේ ව්‍යාපාරයක් පවත්වා ගෙන යන අලහකෝන් රාලලාගේ විමලනාත් චන්ද්‍රසිරි සියබලාගොඩ අලහකෝන් යන අය බන්ධනදායී/ උකස්කරු වශයෙන් පැහැර හැර ඇති හෙයින්, ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ජී. අයි. ගම්ලත් විසින් සියල්ල සහතික කරන ලද 2003.04.11 දිනැති උකස් බැඳුම්කර අංක 668, 2004.01. 28 දිනැති 768 , 2005.01.10 දිනැති 861, 2008.09.17 දිනැති 1605, 2010.07.27 දිනැති 1857, 2012.07.02 දිනැති 2310, 2015.12.14 දිනැති 2745, 2017.04.06 දිනැති 2971, 2017.04.06 දිනැති 2972, 2019.04.04 දිනැති 3164 2014.08.28 දිනැති 2639 2017.04.06 දිනැති 2970 මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත සුරක්ෂිත කර ඇති මෙහි පහත සඳහන් උපලේඛනයන්හි සඳහන් දේපළ සහ පරිශ්‍රය,

සෙලාන් බැංකුව පීඑල්සී විසින් මා හට පවරණ ලද බලය ප්‍රකාරව කෑගල්ල සෙලාන් බැංකුව පීඑල්සී ශාඛා පරිශ්‍රයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID -19 සම්බන්ධව නිකුත්කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

1 වන වෙන්දේසිය - 2022.06.21 වැනි දින පෙ. ව. 11.00

**උපලේඛනය**

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, පරණකුරු කෝරළේ, මාවත පත්තුවේ, කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාසය සහ ප්‍රාදේශීය සභා සීමාව, අංක 50 - ඇකිරියගල ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ ඇකිරියගල පිහිටි බලයලත් මිනින්දෝරු ටී. එන්. කාදර් විසින් සාදන ලද 2002.11.30 දිනැති අංක 4461 සැලැස්මේ නිරූපණය වන මලවිටගේ වත්ත නමැති ඉඩමේ ලොට් 3 ලකුණුකළ බෙදා වෙන්කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විසිදෙකයි දශම පහක් (අ.0, රූ.1, පර්.22.5ක්) විශාල ගස්, ගොඩනැගිලි, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

*දේපළට පිවිසීම.* - කෑගල්ල වෙළඳ සංකීර්ණ හංදියේ සිට නුවර - කොළඹ ප්‍රධාන මාර්ගයෙන් බුලත්කොහුපිටිය පාර ඔස්සේ කි. මී. 2.8 දුරක් පරගම්මන හංදිය දක්වා පැමිණ වම් පසින් ඇති පරගම්මන මීපිටිය පාර ඔස්සේ ඇකිරියගල දක්වා පැමිණ තවත් කි.මී. 1.2ක් ඇකිරියගල කඩ වීදිය දක්වා පැමිණෙන්න. එම පාරට මුහුණ ලා වම් පසින් වන්නට මලවිටගේවත්ත නමින් කැබලි අංක 1 හි ''අලහකෝන් ස්ටෝර්ස්'' වෙළඳ නාමයෙන් පවත්වාගෙන යනු ලබන දේපළ මෙම විෂයගත දේපළ වේ.

ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ජී. අයි ගම්ලත් විසින් සියල්ල සහතික කරන ලද 2003.04.11 දිනැති 668, 2004 ජනවාරි 28 දිනැති 768, 2005 ජනවාරි 10 දිනැති 861, 2008 සැප්තැම්බර් 17 දිනැති 1605, 2010 ජූලි 27 දිනැති 1857, 2012 ජූලි 02 දිනැති 2310, 2015 දෙසැම්බර් 14 දිනැති 2745, 2017 අප්‍රේල් 06 දිනැති 2971, 2017 අප්‍රේල් 06 දිනැති 2972, 2019 අප්‍රේල් 04 දිනැති 3164, උකස් බැඳුම්කර යටතේ උකස්කරන ලද දේපළ,

2 වන වෙන්දේසිය. - 2022.06.21 වැනි දින පෙ. ව. 11.15

**දෙවැනි උපලේඛනය**

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, පරණකුරු කෝරළේ මාවත පත්තුවේ කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාසය සහ ප්‍රාදේශීය සභා සීමාව, අංක 50 - නිල්මල්ගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ, බෝහාර පිහිටි බලයලත් මිනින්දෝරු බී. ආර්. එම්. කුමාරි බස්නායක විසින් සාදන ලද 2014.03.30 දිනැති අංක 283 සැලැස්මේ නිරූපණය වන රද්දල එස්ටේට් හෙවත් නන්දන එස්ටේට් නමැති ඉඩමේ ලොට් 01 ලකුණු කළ බෙදා වෙන්කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් අක්කර එකයි පර්චස් දෙකයි දශම තුනයි අටක් (අ.01 රූ.0, පර්.2.38)ක් විශාල ගස්, ගොඩනැගිලි, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

*දේපළට පිවිසීම.* - කෑගල්ල නගරයේ සිට නුවර කොළඹ විකල්ප පාර ඔස්සේ කි. මී. 1.4ක් දුරින් ඇති පිරවුම්හලට පෙර දකුණතින් ඇති පරගහමුමන මීපිටිය පාරෙන් ඇකිරිගල දක්වා මීටර් 300ක් පැමිණ දකුණට ඇති ඇකිරිගල පාරෙන් මීටර් 800ක් 2/3 කණුව දක්වා පැමිණ, වමට ඇති නිල්මල්ගොඩ නන්දන වත්ත පාරෙන් මීටර් 600ක් පැමිණෙන්න. එම පාරට මුහුණ ලා දකුණට ඇති රද්දල වත්ත හෙවත් නන්දන වත්තෙහි කැබලි අංක 1 ලෙස දක්වා ඇති කොටස විෂයගත දේපළ වේ.

ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ජී. අයි. ගම්ලත් විසින් සියල්ල සහතික කරන ලද 2014.08.28 දිනැති අංක 2639 සහ 2017.04.06 දිනැති 2970 දරන උකස් බැඳුම්කරය යටතේ උකස් කරන ලද දේපළ.

*යෝජනා සම්මුති දැන්වීම .-* 2022.03.18 දිනැති රජයේ *ගැසට් පත්‍රයේද*, ඩේලිමිරර්, අද සහ තිනක්කුරල් පුවත්පත් හි ද පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%,
2. පළාත් අධිකාරියේ බදු සඳහා 1%,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2.5%,
4. විකුණුම් කොන්දේසි පත්‍රය සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,500,
5. ලිපිකරු සහ සෝෂකගේ ගාස්තුව,
6. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු හෝ ගාස්තු වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවිය යුතු ය. ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාලසීමාව ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න. සහකාර සාමාන්‍යාධිකාරි - නීති, 14 වන මහල, සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකතන අංක : 011 2456457, 011-2456473

මෙම වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

චන්දිමා ප්‍රියදර්ශණී ගමගේ,
බලයලත් වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 09, අයි. හයිලෙවල් පාර,
සර්වෝදය මාවත, පනාගොඩ, හෝමාගම.
දුරකතන අංක : 071 4318252, 011- 2173282.

05-208